## 2021/09/14 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/09/14 දින පෙ.ව. 9.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**01. ආගම සිහි කිරීම**

2021.09.14 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු මන්ත්‍රීවරුනි, සියලු දෙනාගෙන් අවසරයි. වසර එකහමාරක් පමණ දීර්ඝ කාලයක් කොරෝනා වසංගත තත්ත්වය හමුවේ, අපගේ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවෙන් විය යුතු කාර්යයන් සිදුකිරීම අපගේ වගකීමක්. සමහර රාජ්‍ය ආයතනවල කටයුතු පෙර පරිදි සිදු නොවුණත්, ජනතාවට වගකියන ආයතනයක් ලෙස අපට වගකීමෙන් මිදෙන්න බැහැ. ඒ අනුව ඉහළ උපදෙස් මත සෞඛ්‍ය නීති රීති වලට අනුකූලව, සභාව මේ ආකාරයෙන් පවත්වන්න මම බලාපොරොත්තු වෙනවා. සභාව පැය 1ක කාලයක් තුළ අවසන් කරන්න. ඒ සඳහා ඔබ සැමගේ සහයෝගය බලාපොරොත්තු වන ගමන්, අද දින මෙම ගරු සභාවට සහභාගි වන ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය පිළිගනිමින්, සභාව ආරම්භ කරනවා.

**(අ)01. 2021.08.10 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත**

2021.08.10 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රි සමන් විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. වැහිපිලි උතුරායාම පිළිබඳව දැණුම්දීම සම්බන්ධව බී.ජී. නලීන් මධුසංඛ , බුදපනාගම, උනන්විටිය විසින් යොමු කරන ලද 2021.09.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. වළකුඹුර, ආරියතිලක මාවත යන මාර්ගය සභාවට පවරා ගන්නා ලෙස ඉල්ලා සිටිමින් වළකුඹුර, ආරියතිලක මාවතේ ප්‍රදේශවාසීන් විසින් යොමු කරන ලද 2021.09.10 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

03. හෝමදොල වතුයායේ පිහිටි ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානය හා පෙර පාසල සභාවට පවරා ගෙන ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානය හා පෙර පාසල කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ගරු අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01 අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම් මත සේවය කරන සේවකයන්ට දැනට ගෙවනු ලබන්නේ මූලික වැටුප පමනක් වන අතර එය දැනට පවතින ආර්ථික තත්ත්වය මත ප්‍රමාණවත් නොවන බැවින් වැටුප් වැඩිකරන ලෙස දිගින් දිගටම ඔවුන් ඉල්ලීම් කරනු ලබයි .එබැවින් මූලික වැටුපට අමතරව රු.260.00 ක ජීවන වියදම් දීමනාවක් 2021 සැප්තැම්බර් මස සිට ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**02.** නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් තල්ගස්වල පොදු වෙළඳ සංකීර්ණය හා ආදාහනාගාරය ඉදිකිරීම සඳහා 2021/09/04 දින මුල්ගල් තබන ලදී.එම කටයුත්ත කඩිනමින් කරන ලෙස පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ මගින් දැනුම්දුන් බැවින් ඒ සඳහා සමරු පලක 2 නාම පුවරු 2 සඳහා දරන ලද වියදම් රු. 98000.00 ක මුදලක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**03.** නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් තල්ගස්වල පොදු වෙළඳ සංකීර්ණය හා ආදාහනාගාරය ඉදිකිරීම සඳහා 2021/09/04 දින මුල්ගල් තබන ලදී.එම කටයුත්ත කඩිනමින් කරන ලෙස පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ මගින් දැනුම්දුන් බැවින් ඒ සඳහා සමාරම්භක උත්සවය සඳහා රු. 110000.00 ක මුදලක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. දකුණු පළාත් සංවර්ධන සැළැස්ම 2021 යටතේ මාපලගම නගරයේ ළමා උද්‍යානය සකස් කිරීම සඳහා රු. ලක්ෂ 10 ක ප්‍රතිපාදන වෙන්වී ඇත. ඒ සඳහා පහත අයිතමයන් මිළදී ගැනීමට තාක්ෂණික කමිටුව නිර්දේශ කරන අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට යොජනා කරමි.

01.Baby basket Swing Double
02. Triple seesaw Fiber Seats
03. Circular Seesaw 04 Fiber seats
04. Pyramid Ladder mini type
05. Fiber Math Slider Mini Type
06. බංකුව ඔන්චිල්ලාව හා ලිස්සන බෝට්ටුව
06. Double Spring Riders

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. කොම්පෝස්ට් අංගනය ක්‍රියාත්මක වන සභාවට අයත් ඇප්තොප්වත්ත ඉඩමේ පිළිසකර කර ඇති අක්කර 02 ක් භූමිය සඳහා කුරුඳු වගාව ආරම්භ කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. අප සභාවේ ආදේශක මුරකරු ලෙස සේවය කරන එන්.එම්.රජිත මයා 2021.08.26 සිට 2021.09.09 දක්වා නිරෝධායනයට ලක්ව ඇත. එමෙන්ම කොරෝනා රෝගය ආසාධනය වීම නිසා 2021.09.09 සිට 2021.09.22 දින දක්වා නැවතත් නිරෝධායනය වීම සිදුව ඇත. ඒ අනුව දෛනික වැටුප් ලබන්නන් කොවිඩ් 19 හේතුවෙන් නිරෝධායනය වන දින ගණන සඳහා දෛනික වැටුප් ගෙවීම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සභා අරමුදලින් ගෙවීම් කිරීමට යෝජනා කරමි.

**ගරු ආණ්ඩුකාරතුමාට යොමු කිරීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු සිදු කිරීමට තීරණය විය**

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු පෙර පාසල් ගුරුවරුන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉගැන්වීම් කටයුතු සිදු කරන බැවින් ඔවුන්ට අදාල දීමනාව ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. ප්‍රාදේශීය සභා කොම්පෝස්ට් නිෂ්පාදනය කරන පිරිස දැනුවත් කිරීම සඳහා ගොවිජන සේවා ආයතනයේ නිලධාරී සම්බන්ධ කර ගුණාත්මක කොම්පෝස්ට් නිශ්පාදනය සම්බන්ධව එක් දින වැඩමුළුවක් කිරීමට යෝජනා කරන අතර, ඒ සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීම ඇතුළු අනෙකුත් වියදම් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් දැරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. 216 ඒ නාගොඩ ඉහල ග්‍රාම සේවා වසමේ පිහිටි දම්මුල්ල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**09. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 23 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**<u>2021.09.14 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2021 අගෝස්තු මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 5821.50 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 551.10 |
| 4501090200 | - මාපලගම වෙලද සංකීර්ණ කොරිඩෝව | - රු. 459.60 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.1795.50 |

**2021 ජූලිමස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 240.00 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු 240.00 |

**02. 2021 ජූලි මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |
| ii. | 0912296537 | - සභාපතිතුමාගේ නිල කාමරය | - රු. 3435.86 |
| iii. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4936.39 |

**03. සී/ස ලංකාබෙල් සමාගම,**
උපසභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත් පියවීම (2021.06.16-2021.07.15) - රු. 613.01

**<u>04 .2021 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 2500.00 |
| කේ.එල්.එන්.ප්‍රමෝද මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 2500.00 |
| අනූෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 1500.00 |

**<u>05.2021 අගෝස්තු මස ගමන් වියදම්</u>**
**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 1000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 2800.00 |

**<u>06. අතිකාල දීමනා ගෙවීම්</u>**
**<u>2021 අගෝස්තු මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9136.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 4601.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 4812.50 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 4242.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8346.00 |

| | | |
|---|---|---|
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 6669.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 5992.00 |
| හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 7632.00 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 525.00 |
| කේ.එම්.එම්.නිශාන්ත ඉදුනිල් මයා | - රියදුරු | - රු. 8132.00 |

**07. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2021 අගෝස්තු මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

**08. එම්.ඒ.ඩිලානි චනද්‍රප්‍රභා මිය,**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක sp/psc/07/01/08(76) හා 2021.05.17 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම - 2021 අගෝස්තු - රු. 10395.00

**09. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2021 ජූනි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 487ක් | - රු. 53098.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 122 ක් | - රු. 13087.00 |
| LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5200.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 120 ක් | - රු. 13040.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5200.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 80 | - රු. 8880.00 |
| තණකොළ කපන මැෂින් සඳහා පෙට්‍රල් ලීටර් 25 | - රු. 3925.00 |
| චේන්සෝ යන්ත්‍රය සඳහා පෙට්‍රල් ලීටර් 17 | - රු. 2669.00 |
| 2T Oil ලීටර් 1 | - රු. 620.00 |
| RA 8569 ට්‍රැක්ටරය සඳහා DS Oil 10L | - රු. 9000.00 |
| මාසික සභා වාර්තා බෙදීම වෙනුවෙන් (පෙට්‍රල් ලීටර් 5) | - රු. 685.00 |
| මන්ත්‍රී කැඳවීම් ලිපි බෙදීම වෙනුවෙන් (පෙට්‍රල් ලීටර් 5) | - <u>රු. 685.00</u> |
| **එකතුව** | **- <u>රු.114009.00</u>** |

**10. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2021 ජූලි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 573ක් | - රු. 63603.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 255 ක් | - රු. 28305.00 |
| LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5550.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 160 ක් | - රු. 17760.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 34 ක් | - රු. 3774.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 60 | - රු. 6660.00 |
| SPLO 3592 ලොරි බවුසරය ඩීසල් ලීටර් 50 | - රු. 5550.00 |
| තණකොළ කපන මැෂින් සඳහා පෙට්‍රල් ලීටර් 25 | - රු. 3925.00 |
| 2T Oil ලීටර් 1 | - රු. 620.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා පෙට්‍රල් ලීටර් 30 | - රු. 4710.00 |
| 2T Oil ලීටර් 1 | - රු. 620.00 |

ජල භීතිකා රෝ මර්ධන එන්නත් කිරීම වෙනුවෙන් ගාස්තු පෙට්‍රල් ලීටර් 6 - රු. 942.00
විශේෂ සභා කැඳවීම් ලිපි බෙදීම වෙනුවෙන් (පෙට්‍රල් ලීටර් 5) - රු. 785.00

**එකතුව** **- රු.142804.00**

**11. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා සැප්තැම්බර් මස මාසික කුලීය ගෙවීම - රු.5000.00

**12. විගණකාධිපති, විගණන කාර්යාලය**

i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**13. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2021 අගෝස්තු) රු.14500.00

**14. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. 2021 ජූලි මස පැවති සභාවාරය සඳහා මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම - රු.28500.00
ii. 2021 අගෝස්තු මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 1260.00

**15. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

LL 7650 කෘ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.17200.00

**16. කේ.ටී.ආර්.ජී.උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්,වදුරඹ**

PF 7360 දරණ කැබ් රථය සඳහා අලුතින් ක්ලච් ප්ලේට් එක දැමීමේ බිල්පත - රු.99533.00 පියවීම

**17. ඩී.ජී. කැළුම් පුෂ්ප කුමාර මයා, උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම**

SPRX 2239 වතුර බවුසරය අළුත්වැඩියා කිරීමේ වියදම් - රු. 18850.00

**18. එම්.ජී.යූ.අමරවීර මයා, සහකාර කළමනාකාරණ ඉංජිනේරු, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය**

PF 7360 කැබ් රථයේ පෙර වාර්තාව ලබා දීම වෙනුවෙන් ගෙවීම් - රු. 500.00

**19. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.08.10 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 4027.00

**20. එම්.ටී.ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.08.10 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 5522.00

ii. ප්‍රාදේශීය සභාවේ 2021.07.13 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 6395.00

iii. ප්‍රාදේශීය සභාවේ 2021.07.28 වන දින පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 2400.00

**21. සිසිර ජයමාන්න ,215/1 බංගම පාර ,උඩුගම**

COVID 19 එන්නත් සඳහා ලබා දුන් සංග්‍රහ කටයුතුවල බිල්පත පියවීම - රු. 76500.00

**පොදු අරමුදල්**

**22. පී.වානක රංග, වානක එන්ටර්ප්‍රයිසස්, කහදූව**

යෝජිත ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීම සඳහා ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.197500.00

**23. චාමර කන්ස්ට්‍රක්ෂන්,උක්ඕවිට,උඩුගම**

උඩුගම ඇප්තොප්වත්ත භූමිය එළි කිරීම සඳහා එක්ස්කැවේටර් යන්ත්‍රය යොදාගැනීම වෙනුවෙන් මුදල් ගෙවී - රු.171860.00

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ඉදිරි ගෙවීම් වාර්තාවෙහි අංක 22,23 ගෙවීම්වල ලිපිගොනුවල පැවති අඩුපාඩු නිසා එම ගෙවීම් දෙක හැර ඉතිරි ඉදිරි ගෙවීම් අනුමත කරන බවත්, එම ගෙවීම් ඉදිරි සභාවට යොමු කර අනුමත කර ගැනීමට කටයුතු කරන මෙන්, යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ලිපිගොනු පරික්ෂා කර බලා නිවැරදි නම් අංක 22, 23 ඇතුළුව සියළු ඉදිරි ගෙවීම් අනුමත කරන මෙන් යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ගෙවීම්වලින් අංක 22 සහ 23 ගෙවීම හැර ඉතිරි ඉදිරි ගෙවීම් සභා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උඩුගම දකුණ 18 බී ග්‍රාම නිලධාරී වසමේ දික්මාදුගොඩ මාවත 2 වන පටුමග මාර්ගය කොන්ක්‍රීට් යොදා සකස් කිරීම සඳහා ඒ සඳහා මාර්ගයේ සිටුවා ඇති විදුලි කණුව බාධාවක් වී ඇති බැවින් මෙම විදුලි කණුව ඉවත් කර බාධාව ඉවත් කර දෙන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ උඩුගම උප කාර්යාලයට දන්වා සිටින ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

i. 194 ඒ උඩවැලිවිටිතලාව කොණ්ඩුගොඩකන්ද මාර්ගය ජේසීබී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 25000.00

ii. 222 ඒ ඌරල දකුණ ග්‍රාම නිලධාරී වසමේ මල්වත්ත හේන මාර්ගය සිලිංඩර් යොදා සංවර්ධනය කිරීම - රු. 26600.00

iii. ගෝනලගොඩ ඔරෙන්කන්ද මාර්ගය ජේසීබී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 125000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

**වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාවෙන් අවසරයි. සභාපතිතුමනි, එන්නත්කරණයේදී වැඩ කරන නිලධාරීන්ට සංග්‍රහයක් සභාවෙන් දෙයි කියලා මම හිතුවා. යටලමත්ත කොට්ඨාසයේ දෙවන මාත්‍රාව දෙන අවස්ථාවෙ කිසිම සංග්‍රහ කටයුත්තක් සිදු වෙලා නැහැ. ඒ වගේම ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී එම නිලධාරීන් චෝදනා කරනවා. අපට ඇල්වතුරවත් ලැබුනෙ නැහැ කියලා. මේ හැමදේම කරන්න ඕන අපේ සල්ලි වියදම් කරගෙන කියලා සභාපතිතුමනි,

ඒවගේම ඒ නිලධාරීන්ගෙන් වියදම් වූ සංග්‍රහ වියදම් ලබාදීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. බොහෝම ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

එම නිලධාරීන්ට එහෙම ඉල්ලීමක් කරන්න බැහැ. මේ කිසිම සංග්‍රහ කටයුත්තක් කරන්න අපි බැඳිලා නැහැ. නමුත් අපි මේ දේවල් කරන්නෙ යුතුකමක් වශයෙන්. රජයේ නිලධාරීන්ට අපි ඒ දේවල් දිය යුතු නැහැ. ඒ නිලධාරීන්ට දීමනාවකුත් දෙනවා. නමුත් මේ සම්බන්ධව අපෙන් ඉල්ලීමක් කරානම්, අපි වියදම් දරනවා. එදින  එහෙම ඉල්ලීමක් අපෙන් කරලා නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් දැනුවත් කල සෑම අවස්ථාවකටම අපි අවශ්‍ය සංග්‍රහ ලබා දීම සිදු කලා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි, ගෝනදෙනිය සණසස පරිශ්‍රයේ ඇති භූමියේ ගස සම්බන්ධව කතා කරනවනම්, එම ගස කඩාවැටීමට ආසන්නයේ පවතින්නේ. එම ගස කපා ඉවත් කර ගන්න කියලා සභාවට සල්ලි බැඳලා. මේ වන තුරු ගස ඉවත් කර ගැනීමට නොහැකි වෙලා තිබෙනවා.

ඒ වගේම ඔබතුමා ගිය සභා වාරයේදී පොරොන්දු වුණා. කොරෝනා රෝගීන් රෝහල් කරා ගෙන යාම සඳහා, නිරෝධායන මධ්‍යස්ථාන වලින් ගෙන ඒම සඳහා, රථයක් සූදානම් කරල දෙන්න බලනවා කියලා. තවම ඒක ලැබිල නැහැ.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මේ සම්බන්ධව උසාවියේ නඩුවක් පවතිනවා. උසාවියට දැනුම් දීලා තියෙන්නෙ. නියෝගය ආ පසු ඉදිරි පියවර ගන්නවා.

රථයක් සූදානම් කිරීම සම්බන්ධයෙන් මෙවැනි අවධානම්කාරී කර්තව්‍යය සඳහා වාහනයක් සහ රියදුරෙක් සොයා ගැනීමට නොහැකි වෙලා තියෙනවා. ඔබතුමන්ලා කවුරුහරි කෙනෙක් ඉන්නවනම් සම්බන්ධ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

උඩුගම හෝමදොල නොම්මර 1 කොටස මේ වන විට අක්කර හතළිහක වත්ත සුද්ද කරනවා. පොල් වගා කිරීම සඳහා. සභාපතිතුමනි, උඩුගම වසමේ වතු ජනතාව පානීය ජලය ගන්නේ එම ස්ථාන වලින්. එම නිසා ජල පෝෂක ප්‍රදේශයක් තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම්තුමා පමණක් මේ සම්බන්ධව කතා කළා. මං හිතන්නේ  ප්‍රාදේශීය ලේකම්තුමා තාවකාලිකව එම පරිශ්‍රය එළිපෙහෙළි කරන එක තාවකාලිකව නවතා දමා තිබෙනවා. මම මේ වන විට දිස්ත්‍රික් නායක රමේෂ් පතිණ මැතිතුමා සහ  සම්පත් අතුකෝරල මැතිතුමා දැනුවත් කළා. මම හිතන්නේ සභාපතිතුමනි, මේ සම්බන්ධව ස්ථිර විසඳුමක් ලබා ගන්න ඕන.

ඒ වගේම එන්නත් ලබාදීමේදී සභාවෙන් හොඳ වැඩපිළිවෙළක් කෙරුණා. ඒ සම්බන්ධව ඔබතුමා

ඇතුළු ඒ සඳහා දායකත්වය දැක්වූ සියලු දෙනාට ස්තූතිවන්ත වෙනවා. එන්නත් කරන වැඩපිළිවෙළ සම්බන්ධව දැනුවත් කිරීමට උඩුගම නගරය පුරා, ගමක්, ගමක් ගානේ ගිහිල්ලා රාත්‍රී 11, 12 වෙනකම් ප්‍රචාරණ කටයුතුවලින් දැනුවත් කළ සියලුම නිලධාරීන්ට නැවතත් ස්තූතිවන්ත වෙනවා. ඒ් වගේම වීථි ලාම්පු ටික මේ වන විට අක්‍රීය තත්වයෙන් පවතින්නේ. මම ඔබතුමාට දිගින් දිගටම ඒ පිළිබඳව පැමිණිලි කළා. ඒ වගේම හෝමදොල බෝක්කුවේ පැත්තක් ගලවාගෙන ගිහිල්ලා තිබුණු බවට, ඒ පිළිබඳ ඇස්තමේන්තුවක් දාන්න කිව්වා. ඒ පිළිබඳ අවධානය යොමු කරලා කිසිවක් ක්‍රියාත්මක වුණේ නැහැ. එයත් ඔබතුමාගේ අවධානයට ගන්නා ලෙස මතක් කරමින්, මම හිතන්නේ අර හෝමදොල එම ස්ථානයට කරනු ලබන අසාධාරණ ඔබතුමාගේ අධීක්ෂණයට යොමු කරලා, ඒ මිනිස්සුන්ට සාධාරණයක් කරන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි අවසරයි. මම හිතන්නේ සමන් මන්ත්‍රීතුමාගේ කතාවේ එක පැත්තක මම යන එන මාගේ ගම, එදා ඉඳලම මේ සභාවේ ඉන්නකොට, මගේ ගමේ ළමයි විස්සක් විතර ඇවිත් මෙම ප්‍රශ්නය සම්බන්ධව මා සමඟ කිව්වා. ඒ වෙලාවේ මගෙන් ඉල්ලීමක් කළා. මෙය නවත්තන්න වහාම පියවර ගන්න ඕන කියලා. සමන් මහත්තයගෙ කතාවෙදි මට යමක් පෙනුනා. වෙනත් වෙනත් අය ගියා කිව්වම මම ගිය එක තමයි එතුමා සඳහන් කළේ. එතකොට මම මැදිහත් වුණා. මගේ ගම, මගේ ඥාතීන් තමයි ඉන්නේ. මගේ සබඳතා තමයි තියෙන්නේ. එතකොට මගේ කොට්ඨාසයේ නොවුනාට මගේ යුතුකමක් තියෙනවා මේ ගැන සොයා බලන්න. මම හැමදාම යන එන පාරේ එතනම උඩ තමයි මේ කාරණය සිදුවන්නේ. මේක මම දේශපාලන කෝණයකින් බැලුවෙ නැහැ. මුළු ගමේම මිනිස්සුන්ට බලපාන පොදු ගැටලුවක්. මුළු ගමම වතුර බොන්නෙ එතනින්. සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ ජල ව්‍යාපෘතියකුත් තියෙනවා. මේ අතර මෙය විශාල බෑවුමක්. මෙය රක්ෂණය විය යුතුයි. මේ සම්බන්ධව දේශපාලනමය වශයෙන්, කොට්ඨාසය ලෙස සලකන එක සම්බන්ධයෙන් යම් කොට්ඨාසයක වැඩ කරද්දි සදාචාරාත්මක අයිතියක් තියෙනවා කොට්ඨාස මන්ත්‍රීවරයා සමඟ කතා කරන්න ඕන කියලා. මෙවැනි පොදු කරුණු වලදී එහෙම බැහැ. දේශපාලන කටයුතුවලදී අපි ඒක කරමු.

වෙනත් කටයුත්තකදී අපි ඇඟිලි නොගැහුවට පොදු කටයුත්තකදී එහෙම බැහැ. ඊට පස්සේ මම ගියේ නැහැ. නමුත් අපේ දේශපාලනික නායකයින්ට මම කතා කලා. එවිට මම ප්‍රාදේශීය ලේකම්තුමා තහනම් කරල ගියත්, නැවත වැඩ කරද්දි මිනිස්සු මට කතා කරලා කියනවා. මෙන්න වැඩ කරනවා කියලා. ඉතින් මම එම ස්ථානයට ගියා. මම ප්‍රාදේශීය ලේකම්තුමා හා පොලිස් ස්ථානාධිපතිතුමාට කතා කරලා, මැදිහත්වෙලා නැවත වැඩ කරන එක නතර කළා. මට කණගාටුවෙන් කියන්න අවශ්‍ය කාරනාවක් තියෙනවා. මට ඉහළින් ඕඩර් එකක් ආවා. කොට්ඨාසයේ වැඩ එතුමාට කරගන්න ඇරලා ඔබතුමා පැත්තකට වෙලා ඉන්න කියලා. මම පැත්තකට වෙලා නිකන් හිටියා. හැබැයි මේ වෙලාවේ මේක දේශපාලනමය ගැටලුවක් නොවන බවත්, සමාජයේ පොදු ගැටලුවක් වන බවත් මම සඳහන් කරනවා. නමුත් මට එසේ කීමට අයිතියක් නැහැ. දේශපාලකයකුට වුවත්, කිසිදු නිලධාරියෙකුට වුවත්, මම ඒ කතාවට එකඟ නැහැ. මම සමන් මහතාට කියනවා මම මැදිහත් වෙලා ඉන්නේ දේශපාලනික කාරණාවකට නෙවෙයි. සමාජයේ පොදු ගැටලුවකටයි කියලා. මම එතුමාට දුරකථනයෙන් මෙහි යථා තත්ත්වය දැන ගැනීමට කතා කළත්, එතුමා මා සමග සම්බන්ධ වුණේ නැහැ. කෙසේ වුවත් මම සම්බන්ධ වුණේ යහපත් වැඩකට කියලා මතක් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමනි අවසරයි. මුලින්ම සභාව මගින් එන්නත්කරන වැඩසටහනට දැක්වූ දායකත්වය පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම එන්නත්කරණය සඳහා දැනුවත් කරමින් ප්‍රචාරණයට යන වාහනයේ මමත් ගියා. යන්න බැහැ. කෘ කැබ් එක යකඩ සැටියක් උඩ වාඩි වෙලා යනවා වගේ තමයි ඒක තියෙන්නෙ. කැඩිලා බිඳිලා විනාශ වෙලා ගිහිල්ලා. සුළු මුදලකින් ඒක හදාගන්න හැකියාව තියෙනවා. ඒ සම්බන්ධව වාහන සම්බන්ධ විෂයට කතා කරලා, ඒ සම්බන්ධව දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි සභාපතිතුමනි, මලගෙදරක් වගේ හදිසි කටයුත්තකදී ලයිට් එකක් දාගන්න අවශ්‍ය වුනහම නිලධාරීන් සෙනසුරාදා ඉරිදා නැති වෙන්න පුළුවන්. එනිසා බහුකාර්ය එකේ ඉන්න කෙනෙක් හරි ඒ දවස් දෙකට ඒ කටයුත්තට යොමු කරන්න පුළුවන් කෙනෙක් බඳවා ගන්න කියලා යෝජනා කරනවා. මොකද වැඩ කටයුතු කරගැනීමේදී අපහසුතාවයට පත් වෙනවා. එම නිසා එම ඉල්ලීම ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මාපලගම මධ්‍ය මහා විද්‍යාලයේ එන්නත්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරුණා. මම පදිංචි වසමේ තමයි එන්නත්කරනය සිදුකළේ. ඒ වගේම සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ට සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය තැඹිලි ලොරියක්ම අරගෙන ගියා. මොකද අපේ ගමට ඇවිල්ලා මේ රෝගයෙන් බේරෙන්න තියෙන එකම ක්‍රමය එන්නත්කරනය පමණක් නිසා. ගිය මාසයේ 26 වෙනිදා ඒම වැඩසටහන තිබුනෙ. සභාපතිතුමා මට මට එම එන්නත්කරණ කටයුත්තට සම්බන්ධ වෙලා, කෑම බීම සංග්‍රහ කටයුතු වලට දායක වෙන්න කිවුවා. මම ඒ දේවල් කළා. අවශ්‍ය බෙහෙත් නොමැති වීම නිසා, දහවල් 11:30 විතර වන විට එන්නත්කරණ වැඩසටහන නැවතුනා. ඒ අවස්ථාවේදී මාපලගම මධ්‍ය මහා විද්‍යාලයේ එළියේ පෝලිමක් තිබුණා. එම ස්ථානයේ පොලිස් නිලධාරීන් සිටියා. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්, වෛද්‍ය නිලධාරීන් වෙනමම ශාලාවක හිටියා. මෙම නිලධාරීන් දවස පුරාම මාත් එක්ක සම්බන්ධ වෙලා හිටියෙ. මේ අවස්ථාවේදී තල්ගස්වල වතුයායේ ද්‍රවිඩ ගුරුවරියක්, ඇයට එන්නත් කර ගැනීමට අවශ්‍යයි කියලා මගෙන් ඉල්ලීමක් කළා. නමුත් ඇයගේ වයස අවුරුදු විසි තුනයි. වැඩ කරන්නෙ ඇඹිලිපිටියේ විද්‍යාලයේ කිව්වා. පළවෙනි මාත්‍රාව ලබා ගත්තා මට දෙවැනි එන්නත තමයි ලබාගන්න ඕන කියලා මට කිව්වා. මම පිළිතුරු දුන්නා මේ දේ කරන්න බැරි බව මම ප්‍රකාශ කළා. මොකද මෙතන ඉන්නේ වයස අවුරුදු 30 ට වැඩි අය සහ 60ට වැඩි අය කියලා. ඒ වගේම මෙතන එන්නත්කරනය සිදුවන්නේ අදාල වසමට අයත් පුද්ගලයන් සඳහා පමණක් කියලා මම කිව්වම, එහෙමනම් එන්නත්කරණය සඳහා ලියාපදිංචි වෙන්න ක්‍රමයක් තිබේද කියා මගෙන් ඇසුවා. එවිට ග්‍රාම නිලධාරීතුමියගෙන් විමසලා, ඔබ සම්බන්ධ කර ගන්නම් කියලා මම කිව්වා. ඉන්පසු එන්නත් කරන ක්‍රියාවලිය අවසන් වෙලා සවස් වන විට පිට්ටනියෙ කවුරුවත් හිටියේ නැහැ. මම එම ද්‍රවිඩ ගුරුවරිය අදාල ග්‍රාම නිලධාරීතුමිය ළඟට කැඳවාගෙන ගියා. ඉන්පසු ලියාපදිංචිය සිදු කළා. ඒ අවස්ථාවේදී නාගොඩ පොලීසියේ රාජකාරි නියුතුව සිටි චමින්ද කියන පොලිස් නිලධාරීතුමා ප්‍රධාන ගේට්ටුව ළඟ ඉඳලා තවත් පොලිස් නිළධාරියෙකු සමඟ පැමිණ මට අධික ලෙස බැන වැදුනා. ඔයා කොහොමද හොර ගේට්ටු වලින් අරන් එන්නෙ කියලා. එම අවස්ථාවේදී මට හිතා ගන්න බැරි වුනා

බනින්නෙ මටද කියලා. මට එහා පැත්තේ අපේ ජේවීපී මන්ත්‍රීතුමා හිටියා. මම ගංජා, කුඩු ගෙනිහිල්ල නෙවෙයි. අඩුම ගානෙ මේ ප්‍රකාශ කරන වෙලාවේ එන්නත්කරණය නැවතිලා තිබුනේ. මගේම තැඹිලි බීලා, මගේම මාළු පාන් කාලා, මටම බනිනවා. එම් ඕ එච් මහත්තයටත් කිව්වම එතුමන්ලා මගේ දිහා බලලා ගියා. ප්‍රධාන ගේට්ටුව ලගට ගිහිල්ලා අපේ ගමේ සාමාජිකයන් එක්ක මට නොසැහෙන්න බැණවැදී තියෙනවා. එම පොලිස් නිලධාරියා හිතන් ඉන්න ඇත්තේ අර කාන්තාව එතනට ගෙනල්ලා, මගේ බලය පාවිච්චි කරලා, මම එන්නත්කරනය කරවන්න හැදුවා කියලා. නමුත් එවැනි සිද්ධියක් එතන වුණේ නැහැ. මෙම දිනය තුළ මගේ දරුවත් නෝනත් පැය 1 ½ ක් පෝලිමේ හිටියා. කොහොම වුණත් රජයේ වැඩසටහනක් නිසා මම නිශ්ශබ්දව හිටියා. එස් එස් පී මහත්තයට හමුවෙන්න මම ගියා. මෙම සිද්ධිය එතුමාට පැමිණිලි කළා. මීට පස්සෙ ඔබතුමා කිව්වත් මෙවැනි දේවල් කරන්න කියලා මම භාරගන්නේ නැහැ. මොකද මෙවැනි දේවල් වලින් මම බොහොම කණගාටුවට පත් වුනා. ඔබතුමාට පවා මෙවැනි දේවල් විය හැකියි. මේ නාගොඩ පොලිසියේම මේ රාජ්‍ය නිලධාරීන්ගෙ ඥාතීන්ට කොයිතරම් එන්නත් ලබා දුන්නද  අපේ වසමට ගෙනැල්ලා. මට සැබවින්ම ඒ ගැන කණගාටුයි. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමනි, මම මුලින්ම අපේ පියල් මන්ත්‍රීතුමාගෙ කතාවට සවන් දුන්නා. ඒ මොහොතේ මමත් එම ස්ථානයේ හිටියා. ඇත්තටම මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමා ගොඩක් අසරණ වුණා. නමුත් මන්ත්‍රීවරයෙකුට අයිතියක් තියෙනවා එහෙම පිටස්තර කෙනෙකු ගෙන්නලා ලියා පදිංචි කරවන්න. අපිත් එහෙම කළා. මමත් මගේ නෝනා, දරුවන් පෝලිමේ එවලා තමයි එදා එන්නත විද ගත්තේ. පියල් මන්ත්‍රීතුමාත් එහෙමයි. මෙතුමාට එදා ලොකු අසාධාරණයක් සිදුවුණා. නමුත් ඒ සම්බන්ධව මෙතෙක් තීරණයක් නැහැ. ඒ් සම්බන්ධව මටත් කණගාටුයි. පොලිස්පතිතුමා 119 කියලා අංකයක් දීලා තියෙනවා අපට. 119 ගහන්නේ මනුස්සයෙක් අසරණ වුනාට පස්සේ. දින තුනකට කලින් විශ්‍රාමලත් තැපැල් ස්ථානාධිපතිගෙ නෝනා කෙනෙක් අංක 119 ට ඇමතුමක් ගත්තා. මොකද තමන්ගෙ වයෝවෘද්ධ දෙමව්පියන් දෙන්නයි අක්කයි ආබාධිත ව ඉන්නවා. එතුමියට බීමතින් පැමිණි හරක් හොරුන්ගේ අයියා පහර දෙනවා, ගෙදරින් ඇදලා දානවා කියලා කිව්ව නිසා තමයි 119 ඇමතුවේ. ඉන්පසු ත්‍රීවිල් එකෙන් පොලිස් නිලධාරීන් ඇවිල්ලා අර 119 ඇමතු අහිංසක අයට තමයි බැන්නේ. ඇයි ඔයාලා 119 ගැහුවෙ කොළඹින් ඇවිල්ලද මෙතන රාජකාරි කරන්නේ. ඇවිල්ලා පොලීසියේ පැමිණිල්ලක් දාන්න කිව්වා. ගිහිල්ලා තවත් බිය වද්දනවා. එවැනි වචන කියන්නේ ඇයි කියලා ඔබතුමා ස්ථානාධිපතිතුමාගෙන් අහන්න.

ඒ වගේම සභාපතිතුමනි, අප  බල ප්‍රදේශය ගත්තම වයෝවෘද්ධ, වැඩිහිටි, අවුරුදු 60 වැඩි එන්නත් ලබා නොගත් කොටසක් ඉන්නවා. ඒ කියන්නේ ගෙවල් වල රෝද පුටුවට හෝ ඇඳ උඩ ඉන්න පිරිසට තවම එන්නත්කරණය සිදුවෙලා නැහැ. මේ සම්බන්ධව සභාවට තමයි වගකීම තියෙන්නේ. එම නිසා ගරු සභාපතිතුමනි, ඉතා ඉක්මනින් වයෝවෘද්ධ ඇවිදින්න බැරි පිරිස සොයාගෙන, ඔවුන්ව ඉක්මනින්ම එන්නත්කරනය සිදුකරන්න කියලා මම යෝජනාවක් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, 2021.09.09 දින මාපලගම මධ්‍ය  මහා විද්‍යාලයේ එන්නත්කරනය සිදුකළා.  එම මොහොතේ අපේ වෛද්‍යවරු අපි සලකන්නෙ දෙවියන් වගේ. අපේ රාජ්‍ය නිලධාරීනුත් සැහෙන මහන්සි වුණා. අඩුම ගානෙ ඇල්වතුර එකක්වත් නැහැ.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඔබතුමා ඔය විස්තරය දන්නෙ එදින 9.30 වන විට අපි සභාවෙන් මන්ත්‍රීතුමා මැදිහත් වී රෝල්ස් ආදි ආහාර යැව්වා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා මගේ වැටුප කොවිඩ් එන්නත්කරණ වැඩසටහන් සඳහා සංග්‍රහ වියදම් වලට යොදවන්න කියලා, මම ඉල්ලා සිටිනවා. නැවත වාරයක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ජංගම රථ යොදාගෙන අවුරුදු 60ට වැඩි වයෝවෘද්ධ පිරිසට එන්නත ලබා දෙන්න කියලා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රීතුමනි, ඔබගේ ඉල්ලීම ඉතාම වැදගත්. කාලෝචිත කටයුත්තක්. ඔබතුමා එහෙනම් කොවිඩ් අරමුදලට එය ලබා දෙන්න. අපි ඔබතුමාට ඒ දීමනාව දෙන්නම්. පෞද්ගලිකව එක අරගෙන, ඒ සඳහා වියදම් කරන්න. නැත්නම් ඔබතුමා ලිපියකින් ලිඛිතව ඉල්ලීම් කරන්න. මොකද ඔබතුමාගේ වැටුප ඔබතුමා ලබා දී ඇති බැංකු ගිණුමට යන නිසා. මන්ත්‍රීතුමනි, අද කල යෝජනාව මමත්, ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතාත් කොරෝනා රෝගය පැතිරුන පළමු අවස්ථාවේම කොරෝනා වසංගත අරමුදලට ලබාදුන්නා. අපි එය සමාජගත කලේ නැහැ.

**ගරු මන්ත්‍රී එන්.ඩබ්ලිව්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමනි, අපේ ගරු සභාවේ හිටපු ගරු මන්ත්‍රී විජේපාල ගුරුගමගේ මැතිතුමා කොරෝනා රෝගය වැලදීම හේතුවෙන් අද දින අපෙන් වෙන්ව ගියා ඒ පිළිබඳව අපගේ බලවත් කණගාටුව ප්‍රකාශ කර සිටිනවා. ඒවගේම මම ස්තූතිවන්ත වෙනවා. ප්‍රාදේශීය සභාවක් හැටියට අපේ ගම් ප්‍රදේශය එන්නත්කරණයේදී ප්‍රචාරණ කටයුතුවලින් හා සංග්‍රහ කටයුතුවලින් දක්වන ලද සහයෝගය වෙනුවෙන් ස්තූතිවන්ත වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු සභාවේ කාර්ය මණ්ඩලයෙන් අවසරයි. සභාපතිතුමනි මට මතක් වෙනවා. මම පෙරේදා හවස කොළඹ යන ගමනේදී කෝට්ටේ නාග විහාරය පසු කරමින් තමයි ගියේ. එම විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ පසුගිය දවස්වල මේ ලක්දෙරණ සාධාරණ සමාජයක් ගොඩනැංවීම සඳහා උත්සාහ ගත්තා. අවසානයේ උන්වහන්සේට ජීවිතයෙන් සමු ගන්න සිදුවුනා. ඒ තමන්ගෙ මතය, මේ රට වැරදි මග යනකොට නිවැරදි මගට ගේන්න දැඩි වෙහෙසක් අරගෙන, උන්වහන්සේ ඒ මගට යොමු වුවත්, ඒ වෙනස ක්‍රියාත්මක වෙනවා, උන්වහන්සේගේ දෙනෙතට දැක ගන්න හැකියාව ලැබුණේ නැහැ. කොහොම වුනත් නොහිතපු දේවල් තමයි ඒ වකවානුවේ සිදු වුනේ. සභාපතිතුමා මගේ කතාව දීර්ඝව කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මං හිතන්නේ මේ සභාවට මට නැවත කතා කරන්නත් වෙන එකක් නැහැ. මම එහෙම කියන්නේ දැඩි වේදනාවකින්. මම මනුෂ්‍යයෙක්. මට යම් ගරුත්වයක් තියෙනවා. මම මෙලොවට බිහි කරපු අම්මා තාත්තට මම ගෞරව කරන්න ඕන. ඒ වගේම මට ඡන්දෙ දීලා මේ තැනට ගේන්න උත්සාහ දරපු ජනතාවගේ මතය තමයි මම ක්‍රියාත්මක කල යුත්තේ. ඊට විරුද්ධව මට වැඩ කරන්න බැහැ. පහුගිය දවස්වල මේ රටේ දැවැන්තම පක්ෂය, අභිමානවත් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය 75 වෙනි සංවත්සරය පසු කළා. මට මතක් වෙනවා. මම

එක්සත් ජාතික පක්ෂයට බැඳුණේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී උපාලි අමරසිරි මහත්තයා ඉන්න කාලවකවානුවේ. එතුමත් එක්ක තමයි මම දේශපාලන ගමන් මග ආරම්භ කලේ. දැන් දීර්ඝ කාලයක් වෙනවා. එදා මෙදා ඉඳලා මට මතක් වෙනවා. මම එක්සත් ජාතික පක්ෂයට ආදරේ කලේ මහාමාත්‍ය ඩී එස් සේනානායක මැතිතුමන්, සර් ජෝන් කොතලාවල මැතිතුමන්, ජේ ආර් ජයවර්ධන මැතිතුමන්, රණසිංහ ප්‍රේමදාස මැතිතුමන්, ඒ වගේ දැවැන්ත නායකයෝ මෙරට බිහි වෙලා, අද මේ රටේ යම් පරිවර්තිත යුගයක් වුනානම්, එතුමන්ලාගේ කාලවකවානුවේ කළ බව අප සියලු දෙනා දන්නවා. අද මේ රට යම් තැනකට ගියා නම්, එතුමන්ලා ගෙනා වැඩසටහන් හරහා තමයි. විශේෂයෙන් නිදහස් වෙළඳ කලාප, විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම සිදුකළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ. හැබැයි අද 75 වන සංවත්සරය පසු කරනකොට, මම කනගාටු වෙනවා සභාපතිතුමනි, අද මේ පක්ෂයට අත් වෙච්ච ඉරණම පිළිබඳව. අපි මේ පක්ෂය ගොඩනගන්න ඔබතුමා දන්නවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් හැටියට මම මගේ ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ කෙනෙක්. තනිව පෝස්ටර් ගහපු කෙනෙක්. මොකද ඒ කාලේ රාජපක්ෂ ආණ්ඩුවේ වර්ධනයට එරෙහිව සමහර අපේ පාක්ෂිකයෝ පාරට බැස්සෙ නැහැ. හැබැයි මම බය වුනේ නැහැ. මම හැම දෙනාත් එක්කම ඔට්ටු අල්ලලා, මගේ පක්ෂයේ ජයග්‍රහණය කරන්න, විවිධ අවහිරතා මැද ඉදිරියට ගියා. නමුත් මේ වෙලාවේ කියන්න කරුණු තියෙනවා. වේදනාත්මක වුවත්, මම මේක ආයෙ මතක් කරනවා. සභාපතිතුමනි පසුගිය කාල වකවානුව තුළ අපි ජනතාව අතර සිටින පුද්ගලයන් හැටියට අපි ජනතාවගේ මතයට සවන් දෙන්න සිදුවුණා. ඔබතුමා දන්නවා. යම් මට්ටමකට කටයුතු කරලා, මම පසුගිය කාලේ සජිත් ප්‍රේමදාස මැතිතුමන් ගාල්ල දිස්ත්‍රික්කයට දෙන්න හිටපු එකම චෛත්‍යය, මුලන ආනන්දාරාම විහාරස්ථානයට ලබලා දුන්නා. ඒ ගයන්ත කරුණාතිලක මැතිතුමාගෙ ඉල්ලීම මත. එහෙම උදව්වක් කරපු කෙනෙක් හැටියට එතුමා යම් දේශපාලන ක්‍රියාමාර්ගයක් ගත්තා. අපේ සමහර සාමාජික නායකයො හිතුවා මම සජිත් ප්‍රේමදාස මැතිතුමාගෙ පක්ෂයට ගියා කියලා. එහි සාමාජිකයෙක් කියලා, අභියෝගයට ලක්කරමින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කිහිපදෙනකුට විනය පරීක්ෂණ සිදු කළා. මේකට මමත්, දිල්රුක්ෂි මන්ත්‍රීතුමියත් සම්බන්ධ වුණා. මම ගිහිල්ලා බැලුවා විනය පරීක්ෂණ කමිටුවේ කවුද ඉන්නේ කියලා. අපේ නායකතුමාගේ කාර්යාලයේ අය තමයි මේ විනය පරීක්ෂණය කළේ. ඒක සාධාරණ විනය පරීක්ෂණයක් නෙවෙයි. මේ දේශපාලන හෙන්චයියන් පිරිසක් මේ විනය පරීක්ෂණය කළේ. මෙතුමන් අද මේ සභාවේ මගේ සාමාජිකත්වය අහෝසි කරලා කියලා ලිපියක් කියෙව්වා. සාධාරණ විනය පරීක්ෂණයක් නොවෙයි සිදු කළේ. දින දෙකක් ගියා. අවසාන දවසේ මෙම ආසනයේ ආසන සංවිධායකවරයා සුනිල් සේනානායක මැතිතුමා, එතුමන් මගේ තාත්තා වගේ මට සලකන්නේ. එතුමත්, මමත්, දිල්රුක්ෂි මන්ත්‍රීතුමියත් තමයි නීතිඥ මඩුල්ලක් හිටියද කියලා මම දන්නෙ නැහැ. මම ඇතුලට ගියාම එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කැමැතිද කියලා ඇහුවා. සුනිල් සේනානායක මැතිතුමා හිටියා. නැහැ. එතුමාගේ ප්‍රශ්නයක් නැහැ කිව්වා. මමත් මගේ ප්‍රශ්නයක් නැහැ කිව්වා. හැබැයි මම කිව්වා මේ බඩගෝස්තරවාදී දේශපාලනඥයො ඉන්නවනම්, එක්සත් ජාතික පක්ෂයෙන් ක්‍රියාකාරී වෙන්නෙ නැහැ. මම නිහඬව ඉන්නවා. විනය පරීක්ෂණ කමිටුවේදි, පක්ෂයත් එක්ක වැඩ කරන්න මම කැමතියි, කියලා මම දිවුරුම් ප්‍රකාශයකුත් දීලා ආවා. මෙන්න සාමාජිකත්වය අහෝසි කරලා. මේ එක්සත් ජාතික පක්ෂය අද තියෙන්නේ කොතනද කියල ඔබතුමාල සියළු දෙනාම දන්නවා. ඇයි මෙහෙම වෙන්නේ. මේක තමයි නොවිය යුත්තේ. ලෝකෙ සියලු රටවල ආදරය ගෞරවය දිනා ගත්ත පක්ෂයක් එක්සත් ජාතික පක්ෂය කියන්නේ. අද ඒ විශ්වාසය මේ ආණ්ඩුවට නැහැ. ඒක තමයි මෙතැනට වැටිල තියෙන්නෙ. නමුත් එක්සත් ජාතික පක්ෂය ගැන විශ්වාසයක් තියෙනවා. එම එක්සත් ජාතික පක්ෂය ගොඩනගන්න ආ පක්ෂය අද වෙනත් මගක යනවා. මොකද තව පිරිසක් ඉන්නවා පහුගිය යහපාලන ආණ්ඩුව කාලේ මෙම පක්ෂය විනාශ මුඛයට ඇදන් ගියා. මොකද මේ පක්ෂය ඇතුලේ ඉඳගෙන

තමන්ගෙ ව්‍යාපෘති කළා. ජනතාවට තමන්ගේ යුතුකම් ඉෂ්ට කළේ නැහැ. කොහොම නමුත් අපි සත පහකවත් හොරකමක් වංචාවක් කරේ නැහැ. කාටවත් බලපෑම් කරල නැහැ. මේක තමයි මගේ බලාපොරොත්තුව. මගේ කොට්ඨාසයේ නෙවෙයි. මගේ ප්‍රදේශයේ ජනතාවගේ සිතුම් පැතුම් වලට අනුව තමයි මගේ දේශපාලන ක්‍රියාකාරකම් සිදු වෙන්නේ. එහෙම නැතුව වෙනත් ආකාරයකින් මට ක්‍රියාත්මක විය නොහැකියි. එම නිසා මට මොන බලපෑම් ආවත්, මේ ඉන්න සියලු මන්ත්‍රීවරුන් මට කතා කරලා කිව්වා. මට නැවත හිතලා බලන්න කියලා. මොකද විපක්ෂ නායකතුමා, තරංග මන්ත්‍රීතුමා, නන්දන මන්ත්‍රීතුමා මේ සියලු දෙනා කිව්වත්, මට එහෙම තීන්දු තීරණ ගන්න බැහැ. මොකද මම වටේ යම් විශාල පිරිසක් ඉන්නවා. මේ පිරිස සමඟ තමයි මම ඉදිරියට යා යුත්තේ. ඔවුන්ට විරුද්ධව මතයක් ක්‍රියාත්මක කරන්න බැහැ. ඉතින් සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය මොන තීරණයක් ගත්තත්, මට එයට හිස නමන්න වෙනවා. මොකද පක්ෂ නායක කාරකාදීන්ට ඕනම තීරණයක් වෙනස් කරන්න පුළුවන්. ඉදිරියේදී යම් මට්ටමකට සාධාරණයක් ඉටු වුවහොත්, ඔබතුමාලත් සමග ඉන්න හැකිවෙයි. නමුත් අසාධාරණ ලෙස සමහර නායකයෝ ක්‍රියාත්මක වෙනකොට, අපි ගිහිල්ලා දණින් වැටිලා, එය ක්‍රියාත්මක කරන්න මගේ කැමැත්තක් නැහැ. මට එච්චරයි කියන්න තියෙන්නේ.

ඒ වගේම සභාපතිතුමනි, සෞභාග්‍යයේ දැක්ම යෝජනා සම්භාරයක් ජනතාව මත තිබ්බා. අද අපට බරපතල ඉරනමකට අත්විදින්න වෙලා තියෙනවා. මොකද රට ඉහලම තැනට ගෙනියන්න පුළුවන් සැලැස්මක් කියලා, අද වී ගොවිතැන ඉවරයි. අපේ පළාත්වල අවසානෙ අපට ඉතුරු වෙලා තිබුණේ තේ ගස විතරයි. අද ඒ්කත් ඉවර වෙන තැනට කටයුතු කරගෙන යනවා. යහපාලන ආණ්ඩුවට පසුගිය දවස්වල චෝදනා කළා. සුළු අපනයන බෝග ප්‍රතිඅපනයනය කරනවා කියලා. අද තේ කොළ ටිකත් ප්‍රතිඅපනයනය කරනවා. මන් දන්නැහැ මේ ආණ්ඩුවට මොන හෙනහුරා ලබලද කියලා. පෝර ටිකටත් විද්දා. දලු කිලෝ එකත් තව ටික දවසකින් රුපියල් තිහ හතලිහකට යන මට්ටමකට ඇවිල්ලා. මම දන්නෑ මේ යහපාලන ආණ්ඩුව සැලසුම් හදනවද කියලා. මාධ්‍යවලින් යන දේවල් මම මේ කියන්නෙ. ඇත්ත නැත්ත මම දන්නෙ නැහැ. අපි මේවා බලාගෙනද ගෝඨාභය රාජපක්ෂ මහත්තයට ඡන්දය දුන්නේ කියලා මිනිස්සු කල්පනා කරනවා.

ඒ් වගේම එන්නත්කරණ වැඩසටහන් ගැනත් කතා කළා. අප ප්‍රදේශයේ ජනතාවට ලබා දුන්නේ සයිනොෆාම් එන්නත. මේ බෙහෙත විදලා අප ප්‍රදේශවල මිනිස්සුන්ට යම් යම් රෝගාබාධ මතු වෙමින් පවතිනවා. මොකද මේ බෙහෙත් එකේ ප්‍රමිතියක් නැහැ කියලා යම් මට්ටමකට සැකයක් තියෙනවා. චීනයේ පාවිච්චි කරපු බෙහෙත් එක නෙවෙයි ලංකාවේ ගෙනැල්ලා තියෙන්නේ කියලා මතයක් තියෙනවා. මේ බෙහෙත් විදීමෙන් අනතුරු ව පපුවේ, බෙල්ලෙ, කොන්දේ, හිසේ ආබාධ ඇති වෙමින් පවතිනවා. හොඳ ප්‍රමිතියෙන් යුතු බෙහෙත් එකක් තමන්ගේ රටේ ජනතාවට ලබා දෙන්න බැරි ආණ්ඩුවක් තමයි මේ තියෙන්නෙ. රජයේ වැඩි මුදලක් වියදම් කරලා, බාල බෙහෙත් එකක් ගෙනැල්ලා, ජනතාව ලෙඩ කරලා තියෙන්නේ. අපේ රටේ ජනතාවට ආහාර නැතිව හාමතේ මැරෙන්න වෙලා තියෙන්නෙ. ඒකෙ ශාපය ඔබතුමන්ලාට නුදුරු දිනයකදීම ලැබෙයි. මට මන්ත්‍රීකම ඇතැයි නැතෙයි කියලා නැහැ. මම මිනිස්සු එක්ක ඉන්නවා. දේශපාලන පක්ෂවල නායකයෝ තීන්දු තීරණ ගනියි. නමුත් ජනතාව පතන යුක්තිගරුක සාධාරණ සමාජයක් සඳහා කෙරෙන ඕන දේශපාලන නායකයෙක් හරහා හෝ අපේ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ කරන්න කැපවෙන බව පවසමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ අපේ හෝමදොල වතු යායෙන් කෙරෙන ඉදිකිරීමක් නිසා සම්පූර්ණ ගම්මානයකට, ජල පෝෂක ප්‍රදේශයකට හානි සිදු වෙනවා. ඒ සම්බන්ධයෙන් මන්ත්‍රීවරු දෙපලක් ගැන සමන් මන්ත්‍රීතුමා කතා කලා. එම නිසා මම කතා කරන්න හිතුවා. මේ බලප්‍රදේශයේ කවදාවත් ඒවට ඉල්ලීම් නොකරන විශාල වැදගත් පිරිසක් මේ මගින් හානියට පත්වන උඩුගම් වසමේ ඉන්නවා.මමත් ගෝණදනියෙ පදිංචි වෙන්න කලින් ඔය වසමෙ තමයි හිටියෙ. මමත් බාර්හන්දිය ආසන්නයේ හිටියට මමත් වතුර ලබාගත්තේ ඔය ප්‍රදේශය හරහා තමයි. (වත්තෙන් තමයි ලබාගත්තේ). එම නිසා ඔබතුමාලා ගම නියෝජනය කරන්න ඉන්න මන්ත්‍රීවරු විදිහට මේ සම්බන්ධව සොයා බලන්න ඉදිරිපත් වෙන්න කියලා, මේ සියලු මන්ත්‍රීවරුන් ඉන්න නිසා මම කියනවා. අපි මේ කොට්ඨාශ ක්‍රමය ඡන්ද ක්‍රමයට යොදා ගත්තට, මිනිසුන් අපෙන් ඉල්ලීමක් කළහම, මට නම් එය අදාළ නැහැ. මගේ පක්ෂයට අදාළත් නැහැ. මොකද විපක්ෂ හත් දෙනෙක් ඉන්නවා. අපි කාගෙන්වත් අහන්න වත් අවශ්‍ය නැහැ. මොකද ඒවාට නිශ්චිත විසඳුමක් අදාල වසමේ මන්ත්‍රීතුමාත් මැදිහත් වෙලා කරන්න පුළුවන්. ඒක ඔබතුමාලා තේරුම් ගන්න. 2011 වර්ෂයේ ඡන්දය තිබුනේ කොට්ඨාස ක්‍රමයට නෙවෙයි. ඉතින් මේ ස්ථානයේ ඉන්නේ අපේ අසල්වාසීන්, ඥාතීන්, හිතවතුන්. ඒ අනුව සිද්ධියක් බලලා අපට ඒකට සම්බන්ධ වෙන්න වෙනවා. ගරු සභාපතිතුමනි, මේ සියලු මන්ත්‍රීතුමන්ලා එම ප්‍රශ්නෙදි එකම මගක යන බවක් මට නම් ජේන්නේ නැහැ. මේ ප්‍රශ්නේ කොටසක් බෙදා ගන්න බැරි එක තමයි ජේන්න තියෙන්නේ. සමහරු මැදිහත් වෙනවට සමහරු කැමති නැහැ. ඒක අපට අදාල නැහැ. හැමෝම කියන්නේ මේක කෙරෙන්න ඕන කියලා නේ. මෙම විනාශය නවත්තන්න ඕන කියලා (ජල පෝෂක ප්‍රදේශයට හානි කිරීම) නමුත් ප්‍රතිවිරුද්ධ මත නැතත්, නමුත් මේක කෙරෙන්න ඕන. ඇයි ඔයා ආවෙ එහෙම කියන්න කාටවත් අයිතියක් නැහැ. මොකද අපි කණ්ඩායමක් විදියට මේ ප්‍රාදේශීය සභාව විදිහට ඔබතුමාගේ බලය පාවිච්චි කරලා හරි, වැරැද්දක් වෙනවා නම්, එම වරද නිවැරදි කරන්න තමයි අපට අවශ්‍ය වෙලා තියෙන්නෙ. ඇත්තෙන්ම මම දිස්ත්‍රික් නායක සම්පත් අතුකෝරල මැතිතුමාට පවා ලිපියක් දැම්මා. මම කවදාවත් කරන්නේ නැති වැඩක්. නමුත් මෙවැනි ප්‍රශ්නයක් හෝමදොල වත්ත සම්බන්ධයෙන් තියෙනවා. ඔබතුමාට කරන්න පුළුවන් දෙයක් තියෙනවා නම් කරන්න කියලා ඉල්ලීමක් කළා. වනිගරත්න මන්ත්‍රීතුමා කිව්ව වගේ, ඉදිරියේදිත් මෙවැනි ප්‍රශ්නයක් වුනොත් අපි සහභාගිවෙනවා. කොට්ඨාශ මන්ත්‍රීතුමාගෙන් අහන්න අවශ්‍යතාවයක් නැහැ. ඒ වගේම මම අද ගරු සභාවට ආපු වෙලාවේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. පසුගිය සභාවෙදිත් යෝජනා කළා. මම දන්න තරමින් මෙය 100% ක් නිවැරදි කියලා මම මේ ප්‍රකාශය කරන්නෙ. මේක පහුගිය කාලේ වජිර අබේවර්ධන මැතිතුමා, පළාත් පාලන ඇමති වරයා වශයෙන් කළ යෝජනාවක්. ආසියානු සංවර්ධන බැංකු හරහා තමයි මේවට මුදල් අනුමත වෙලා තියෙන්නෙ. වැලිවිටිය, දිවිතුර, නෙලුව, නාගොඩ ඇතුළු මම දන්නා තරමට ප්‍රාදේශීය සභා හතරකට ආදාහනාගාර හතරක් ඉදිකිරීමේ යෝජනාව අනුමත කරලා, ගිවිසුම් ගත කර තිබුණා. හිටපු රජය ආසියානු සංවර්ධන බැංකුව සමඟ එතන ඉඳලා, අද වෙනකන්ම ඒ් ආයතනයක් සමඟ කිසිදු සම්බන්ධතාවයක් ඇති වෙලා නැහැ කියලා, මම මේ අවස්ථාවේදී කියනවා. මම මේ විස්තර හොයලා බලලා ආපු නිසා මේ කතා කරන්නේ. අද වෙනකම් මේ රජය එවැනි යෝජනාවක් හෝ මෙවැනි සිද්ධියකට ගිවිසුම් ගත වීමක් හෝ අද වෙනකම් සිදුවී නැති බව මම සොයා ගත්තා. එහෙම නැහැ කියලා කියනවා නම්, ලිඛිතව දෙන්න. පළමුව ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. වජිර ඇමතිතුමාට සහ ගයන්ත ඇමතිතුමාටත් ඔබතුමා ස්තුති කළා කියලත් මට කිව්වා. ඔබතුමාගෙ කාලේ සහ අපේ කාලේ කළ යෝජනාවක් මේ ආකාරයෙන් සිදුවීම සම්බන්ධව අපි සතුටු වෙනවා. නැතිව අපිට මේකෙ කොටස බෙදා ගන්න නෙවෙයි. ගයන්ත

ඇමැතිතුමා තමයි ඒ කාලේ LRC එකෙන් ඒ සඳහා ඉඩම ලබා දුන්නේ. මේක මොන ඇමති කලත්, රටේ සල්ලි. ඒ දෙන්නගෙම සල්ලි නෙවෙයි. මොකද මේ දේ වෙන්න ඕන දෙයක්. නමුත් මෙම මුදල් ලබාදෙන ආයතන සම්බන්ධයෙන් කිසිදු කතාබහක් වෙලා නොමැති බව මම වගකීමකින් සොයා බලලා තමයි කතා කළේ.

ඒ වගේම ගරු මන්ත්‍රීතුමනි, අපේ නන්දන මන්ත්‍රීතුමාත්, මමත් පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කළා. ඒ්වට අනුමැතිය ලැබුණා. ඒ සියල්ලම ඔබතුමාට තමයි. මේ සභාවට තමයි. මාපලගම ක්‍රීඩා පිටියටත්, උඩුගම උප කාර්යාලයේ පෙර පාසල ආසන්නයේ ළමා උද්‍යානයක් සහ මාපලගම ළමා උද්‍යානයක් හදන්න. ලක්ෂ 50ක මුදලක් අනුමත වුණා. මම දන්නැහැ ඒකද මේකද කියලා. නමුත් හොයල බලන්න. ඔය ලක්ෂ 50 ඇවිල්ල තියෙන්නේ ඒකද කියලා. මොකද ලක්ෂ 50 ක මුදල ඔබතුමන්ලාට ඕනම විදිහකට වියදම් කරන්න පුළුවන්. මොකද ඔබතුමන්ලා කියන්නේ ක්‍රීඩා අමාත්‍යාංශය හරහා ලක්ෂ දහයක් ලැබුණා කියලා. සමහරවිට ඒ ලක්ෂ 50 කුත් වෙන්වෙලා ඇති. ආවෙ නැත්නම් ඒ සම්බන්ධව සොයා බලන්න. එයින් ලක්ෂ දහයක් ළමා උද්‍යානයට වියදම් කරලා, ඉතුරු 40 පිට්ටනිය හදනවද මම දන්නෙ නැහැ.

අප ගෝණදෙනියේ මන්ත්‍රීතුමා ඉන්නවා. ගෝණදෙනියේ ව්‍යාපෘති 05 කට පළාත් පාලන අමාත්‍යාංශය හරහා මුදල් වෙන් කළා. ඡන්දය පැවැත්වෙන නිසා ඔබතුමා කිව්වා ගිවිසුම් අත්සන් කරන්න එපා. ඡන්ද කාලෙ කියලා, එකම වැඩයි කරලා තිබුණේ. ගෝණදෙණියේ රජ මහා විහාරයේ ඉතුරු වැඩ ටිකටත් ප්‍රතිපාදන පාස් වෙලා ඇති. ඒ වැඩ ටික කෙරුනොත් අපට ලකුණු දාගන්න නෙවෙයි. ඔබතුමන්ලාටත් කරදරයක් නැතිව කටයුතු කරගෙන යන්න පුළුවන්. සම්පත් අතුකෝරල මන්ත්‍රිතුමා ඒ් කටයුත්ත සම්බන්ධව දන්නවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ඔබතුමා කොන්ත්‍රාත්කරුවන් යවලා නැති නිසා ඒ සල්ලි ගියා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

එම අවස්ථාවේ පැවැති තත්ත්වයත් එක්ක ඡන්දය තිබෙන නිසා සභාපතිතුමා ගිවිසුම් අත්සන් කරන්න එපා කියලා කිව්වා. ඒ අනුව සම්පත් අතුකෝරල මැතිතුමා පාර්ලිමේන්තුවට ගිහිල්ලා සභාවට ආ පළමු දවසේ මට දුරකතන ඇමතුමක් දුන්නා. මල්ලි ඔයාලගේ කාලේ දාපු වැඩ වගයක් තියෙනවා. අපි එ්ක කලාට කමක් නැද්ද කියලා ඇහුවා. ලොකු දෙයක් මන්ත්‍රීතුමනි, ආපු මුදල් නැවත යවන්න එපා කියලා ප්‍රකාශ කළා. ඔබතුමා මේ සම්බන්ධව නැහැ කිව්වොත්, සභාපතිතුමනි, ලබන සභාවට මම ගෙනත් පෙන්නන්නම් මෙම අනුමැතිය සිදු වුන ආකාරය සියලුම ලේඛන ගෙනැල්ලා මම සභාවට පෙන්වනවා. මම වැඩි වෙලා කතා කරන්නෙ නැහැ. මන්ත්‍රීවරු විදිහට අපි ඇත්තෙන්ම කණගාටු වෙනවා. අපි අදහස් ප්‍රකාශ කරන්න යාමේදී, අනෙකුත් මන්ත්‍රීවරු කොට්ඨාස ක්‍රමය මැතිවරණ ක්‍රමයේ පහසුව සඳහා තිබුනට, ඔබතුමාගේ දේශපාලන කටයුතු සඳහා තියාගන්න. අනෙකුත් වැඩ වලට පටලවා ගන්න එපා කියලා ඔබතුමාගේ කණ්ඩායම දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මම දීර්ඝ වශයෙන් කතා කරන්න යන්නේ නැහැ. ඒත් මට අත්‍යාවශ්‍යම දෙයක් තියෙනවා කියන්න. වසන්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලද කරුණු

සම්බන්ධයෙන් නිවැරදි වෙන්න ඕන එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අපි සියලු දෙනාම සාකච්ඡා කළා. අපි අවසන් මොහොතේදීත් නැවත එන්න කිව්වා. හැබැයි එනවනම්, අපි පක්ෂයක් හැටියට අම්මා තාත්තා කෙනෙක් අපට ඉන්නවා. ඔවුන් එක්ක තමයි අපි වැඩ කරන්න ඕන. එහෙම නොවෙනවානම්, දෙමව්පියෝ හැටියට මව, පියා තීරනයක් ගන්නවා. මම මේ උදාහරණයක් කියන්නේ. අපිත් සහෝදරයා හැටියට ඔහුට ආරාධනා කළා. අපෙන් වෙන්වෙලා යන්න එපා. අපිත් එක්ක එකතු වෙලා වැඩ කරමු කියලා. එතුමා සමාජය දිහා බලලා, එතුමා අපෙන් වෙන් වෙලා ගියා. ඒත් මම අවසාන මොහොතේත් එතුමාට ආරාධනා කලා. යන්න එපා. එන්න කියලා. මම ඒ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කතා කරන්නේ නැහැ. අද ඔබ එක්සත් ජාතික පක්ෂයේ නෙවෙයි. සමගි ජන බලවේගය කියන්නේ වෙනමම පක්ෂයක්. එතුමා වෙනම පක්ෂයක වැඩ කරන නිසා තමයි ඔහුට විරුද්ධව විනය පරීක්ෂණයක් කළේ. චන්දිමා මන්ත්‍රීතුමිය ඉන්නවා. එතුමිය ගිහිල්ලා, නැවත පක්ෂයට සම්බන්ධ වුණා. තීන්දු දෙකක් ගත්තෙ නැහැ. එම නිසා එතුමියට අපිත් එක්ක වැඩ කරගෙන යාමට හැකි වුණා. ඒපමණයි මෙතන සිද්ධ වුණේ. මම නැවත වාරයක් වගකීමකින් යුතුව ඔබට ආරාධනා කරනවා නැවත වගකීමෙන් යුක්තව අප අතරට එන්න. අකීකරු පුද්ගලයකු සමඟ මේ ගමන යන්න එපා කියලා. අපි සජිත් ප්‍රේමදාස මහත්මයා දකින්නේ ඒ විදිහට. මේ මැතිවරණයකට යන වෙලාවක් නෙවෙයි. සජිත් මහත්තයා කියනවා මැතිවණයකට යන්න අවශ්‍ය කාලයක් කියලා. ඔබතුමාට තේරෙයි තව ටික කාලෙකින් සමගි ජන බලවේගය කියන්නේ පුස්සක් කියලා. එක්සත් ජාතික පක්ෂය කියන්නෙ පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂයක් කියලා. නැවතත් ඔබතුමාට ආරාධනා කරනවා.

ඒ වගේම අද ජීවත් වෙන්න බැරි කාලයක්. සහල් ටික නැහැ. සීනි නැහැ, පරිප්පු නැහැ. මහ බැංකු අධිපතිවරයාට ලක්ෂ 19 ක් අනුමත මත කරනකොට, අහිංසක ගුරුවරුන්ට ගුරු පඩි 5000.00 ක සොච්චමක් වැඩි කරගන්න බැරි ආණ්ඩුවක්. අද මේ අපි සියලු දෙනාම එක් පවුලකට, රාජපක්ෂ පවුලට බදු ගෙවලා නඩත්තු කරන්නේ. අද ජීවත් වෙන්න ඉතාමත් අසීරු තත්ත්වයක් තියෙන්නේ. තමුන්නාන්සේලා වැඩ කරන්න ඕන නිත්‍යානුකූලව. විශේෂයෙන්ම ලේකම්තුමියනි, ප්‍රවේසම් වන්න. ඔබතුමිය රාජ්‍ය සේවකයෙක්. ඔබතුමියට විශ්‍රාම වැටුපක් තියෙනවා. ඔබතුමියගේ කාලය එහෙමමයි. අන්න ඒ නිසා මේ අත්සන් කරන චෙක්පතකට නීත්‍යානුකූලභාවයක් තියෙන්න ඕන. එහෙම නැතුව චෙක්පත් අත්සන් කළොත්, මෙතුමා මාස දෙක තුනකින්, තව අවුරුද්දක් දෙකක් මෙතන ඉන්න පුළුවන්. නැවත ඡන්දයකින් තමයි එන්න ඕන. එහෙම නෙවෙයි ඔබතුමියලා සියලු දෙනාම ආරක්ෂා කළ යුතුයි. එම නිසා මෙතනට එන හැම දෙයක්ම නීත්‍යානුකූලව තිබිය යුතුයි. නීතියානුකූල නැති කිසිම දෙයක් තියෙන්න බැහැ. අද දුර්වල වෙලා මොකද පරිනත ලේකම් කෙනෙක් නැති නිසා. චෙක්පත් පරිපාලනය නිසියාකාරයෙන් සිදු වෙන්නේ නැහැ. මේ මගේ පෞද්ගලික මතය. කොවිඩ් එන්නත්කරණය වංචනික ලෙස ක්‍රියාත්මක වෙනකොට, එය හමුදාවට පාලනය කරන්න දීම මගින්, එය නිසි ආකාරව වුණා කියලා මම දකිනවා. හමුදාවට මම ස්තූතිවන්ත වෙනවා. ඔබතුමන්ලා ගන්නා සෑම තීරණයක්ම, හදවතට එකඟව, නිත්‍යානුකූලව, ගන්න ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රීනී ඉනෝකා නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම මේ අවස්ථාවේ නැගී සිටියේ අපේ වනමල් මන්ත්‍රීතුමා ගැන වචනයක් කතා කරන්න. මොකද එතුමා කිව්වා අද විතරක් එන්න වේවි කියලා. එතුමා ගැන කතා කරනකොට, කාන්තා පාර්ශ්වයෙන් අපි තුන්දෙනාට අවවාදානුශාසනා දෙන්නෙත්, අපට ප්‍රශ්නයක් ආවමත්, කතා කරලා අහන්නේ එතුමාගෙන්. එතුමා ඔහොම නෙවෙයි

මෙහෙමයි වෙන්න ඕන කියලා අවවාද දෙනවා. ඇත්තටම අපි කාන්තා පාර්ශවයේ තුන් දෙනෙක් ආවා කියලා, සමහර අය තමන්ගේ තැන අහිමි වුණා කියලා කියද්දි, වනමල් මන්ත්‍රීතුමා අපි සමග හැමදාම සිටියා. ඒ කොහොම වුණත් එතුමා මෙතන නොහිටියත්, එතුමා කවදාහරි හොඳ තැනක ඉඳීවි කියල මගේ හිතේ තියෙනවා. ලොකු ශක්තියකින් එතුමා තමයි උත්සවයක් අවස්ථාවකදී වුවත් සියලු බර කරට ගෙන කටයුතු කරන්නේ. වෙලාවට පැමිණිලා, වෙලාවට වාඩිවෙලා වැඩ කටයුතු කරන කෙනෙක් නෙවෙයි. එතුමා අපේ පක්ෂයෙන් අයින් වීම ගැන අපි කණගාටු වෙනවා. එතුමාගේ ගමන සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මෙම සභාව කරගෙන ගිය ආකාරය පිළිබඳව අදහස් දැක්වීමට කලින් මුලින්ම මගේ අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි. ගරු සභාපතිතුමා පසුගිය දවසක ඔබතුමාට මම දුරකථනයෙන් කතා කළා. මේ සම්බන්ධව වටවල වැව්ලි සමාගමට අයත් නාකියාදෙණිය කටුපොල් අපද්‍රව්‍ය මාමනදොළට මුදාහැරලා, ඒ ගැන කටයුතු කරන්න කියලා. ඇත්ත වශයෙන්ම මමත් ඇසින් දුටු සාක්ෂියක්. මේ පිළිබඳව සොයා බැලුවම සඳුන් ජයවීරත්, මමත් ඊට කලින් දවසෙ මෙම අපද්‍රව්‍ය තියෙන නල කිහිපයක් මෙම ඇළට මුදාහැරලා තිබුනා. කලින් දවසේ 7ට විතර මුදා හැරපු අපද්‍රව්‍ය පිළිබඳ අපි දැක්කෙ, පස්සෙන්දා 7ට විතර. එතකොට අපද්‍රව්‍ය බැහැර වෙලා ජලය හොඳ තත්වයක තිබුනේ. එහි අපට ෆොටෝ එකක් ගන්නත් බැහැ. මේ ගැන පරීක්ෂණයක් කරලා වැඩක් නැහැ. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්තයා ගෙන්වන්න විදියක් නැහැ. රූපවාහිනියෙන් ගෙන්වලා වැඩකුත් නැහැ. පටිගත කරන්න විදිහක් නැහැ. අපේ සඳුන් මන්ත්‍රීතුමා වටවල වැව්ලි සමාගමේ කළමනාකරණ මහත්මයාට කතා කරලා තිබුණා. එතුමා පිළි අරගෙන තිබුණා මේක මොකක් හරි වෙන්න ඇති කියලා. තවත් නිළධාරීන් කිහිප දෙනෙක් එක්ක කතා කළාම, ඒ අයත් පිළිගෙන තිබුණා. නමුත් මේක අපට ඔප්පු කරන්න හැකියාවක් ලැබුණේ නැහැ. මම මේ ගරු සභාවෙන් ඉල්ලීමක් කරනවා. නැවතත් මේ වැරැද්ද කරන්න දෙන්න බැහැ. උසාවිය, අධිකරණය තීන්දුවක් දීලා තියෙනවා. නැවත වරක් අපද්‍රව්‍ය දැම්මොත් මෙම කර්මාන්ත ශාලාව වහනවා කියලා. එම නිසා අපි දන්නවා මේකෙන් වන හානිය. තව අවුරුදු 10කින් කටුපොල් වගාව, වතු ප්‍රදේශවලින් අයින් කරන්න මෙම රජය ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා. ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධයෙන් වටවල වැව්ලි සමාගමේ කළමනාකාරතුමා, කර්මාන්ත ශාලාව දැනුවත් කරලා අපටත් පිටපත් දාන්න. නැවත වරක් ප්‍රදේශවාසීන්ට පැමිණිලි කරලා හෝ මෙවැනි ලෙස කටයුතු කරලා නැවත වරක් අපද්‍රව්‍ය මුදා හැරියොත්, අපි ඊට වඩා තීරණාත්මක තීන්දුවකට යන බවට ඔවුන්ව දැනුවත් කරලා, අපටත් පිටපත් දාන්න කියල ඉල්ලා සිටිනවා. ඊළඟට මේ ගරු සභාවේ වනමල් මන්ත්‍රීතුමන් මේ සභාවෙන් සමුගෙන යන බව කතා වුනා. ඒක ඉතින් එම පක්ෂයේ ප්‍රශ්නයක්. දැන් වනමල් මන්ත්‍රීතුමාම කියනවා එම පක්ෂයේ තිබෙන තත්වය. ඇත්තටම ඒ සම්බන්ධව අපේ කණගාටුව ප්‍රකාශ කරන අතර මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි දීර්ඝ වෙලාවක් කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් මේ වෙලාවේ, ඉතාම අමාරු කාල වකවානුවක් තුළ, අප ජීවත්වන පරිසරය තුළ, මම හිතන්නේ කවුරු මේ රට පාලනය කළත්, කාට වුණත් කරන්න පුළුවන් දේ, මේ දේ තමයි. මොකද මම හැමදාම කතා කරනවා අපේ රටේ මෙම ආර්ථික රටාවට පහුගිය පාලකයින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඇරුණම අනිත් හැම දෙනාම මේකට වගකියන්න ඕන. ඒ නිසා තමයි අපට මේ වගේ තත්ත්වයක් උදාවෙලා තියෙන්නේ. අපේ රටේ දේශීය කර්මාන්ත, දේශීය නිෂ්පාදන සියල්ලම අතහැරලා,

පිටරටෙන් සියල්ලම එනකන් බලා හිටිය ජාතියක් හැටියට, දැන් එකේ අනිසි ප්‍රතිඵල භුක්ති විඳින්න වෙලා තියෙනවා. අද ලංකාවේ අත්‍යාවශ්‍ය නොවන බඩු කිහිපයක් තහනම් කරන්න සිදුවෙලා තියෙනවා. උදාහරණයක් විදියට ඒ කාලේ අපි අතින් හදාගත්ත සරුංගලය, අද පිටරටින් ගේන තත්ත්වයකට අපේ ආර්ථිකය හැඩ ගැහිලා තියෙනවා. අපට අවශ්‍ය දේවල් අපේ රටේම නිෂ්පාදනය කරන්න, මේ කොරෝනා වෛරසය ආදර්ශයක් දීල තියෙනවා. එනිසා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එතුමන්ට සුබ විහරණය සඳහාවත්, රාජපක්ෂ පවුල ගොඩනඟන්න වත් නෙවෙයි මේ කටයුතු කරන්නේ. එමෙන්ම මේ රටට ඉතා අමාරුවෙන් කාබනික පොහොර හඳුන්වා දෙන්නේ, මේ රටේ විශාල ජනතාවක් නිදන්ගත රෝග, වකුගඩු රෝග, බෝ නොවන රෝග වලින් පෙලෙනවා. පසත් වතුරත් එක්ක කරන රසායනික පොහොර භාවිතය තුළින්, පස සහ සියල්ල විකෘති තත්ත්වයට පත්ව තිබෙනවා. මෙය වළක්වා ගැනීමට නම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කළ යුතුයි. මේ බෝ නොවන රෝග වළක්වා ගැනීමට නම් යම්තාක් දුරකට හෝ මෙම ක්‍රියාදාමය සිදුවිය යුතුයි. නැත්නම් අපට මේ රටේ ජීවත් වීමට නම් විශාල මුදලක් හා කැපවීමක් කරන්න ඕන. ඒ් වගේම රටේ සංවර්ධනය කොයි වෙලාවකවත් නතර කරලා නැහැ. කාබනික පොහොර සම්බන්ධයෙන් නිලධාරීන්ට මුදල් පවා දීලා තමයි මුලින්ම මේ කාබනික පොහොර ප්‍රචලිත කළේ. නමුත් අද තත්වය වෙනස් වෙලා. එම නිසා මෙම ක්‍රියාදාමය ඔප් නංවන්න නම්, කෘෂිකර්මාන්තය පැත්තෙන් හැම දෙනාගේම මතය එක තැනකට එන්න ඕන. මේ කොරෝනා වසංගතය වෙලාවේ අපිට ජීවත් වෙන්න අමාරු තත්ත්වයක් තිබෙද්දීත්, ඉතා විශාල මුදලක් වැය කරලා තමයි එන්නත්කරණය පවා සිදු කරන්නේ. ඒ වගේම අපිට මේ කාලේ ජීවත් වීමට පවා අමාරු තත්ත්වයක් උදාවෙලා තියෙන්නේ. මොකද විදේශ සංචිත නැති වීම තමයි මේකට මූල. එල්ටීටීඊ සංවිධානය මර්දනය කිරීමට වඩා තුන්ගුණයක් විශාල මුදල් කොටසක් මේ කොරෝනා වසංගතය වෙනුවෙන් වෙන් කරන්න වෙලා තියෙනවා. ඒ නිසා මම හිතනවා ගෝඨාභය රාජපක්ෂ මහතා මේ රට පාලනය කරන්න නොහිටින්න, මේ රට ඉතාම අමාරුවෙන් තමයි කරගෙන යන්න වෙන්නෙ කියලා. මේ සඳහා සියලු දෙනාගේ සහයෝගය, පක්ෂ, පාට භේදයකින් තොරව ලබාදිය යුතු යි. මේ නාගොඩ බල ප්‍රදේශය තුළ අවුරුදු 30 ත් 60 ත් අතර එන්නත්කරණය ලබාදී අවසන් කරලා තියෙන්නේ. 19-29 වයස් කාණ්ඩයන් සඳහා එන්නත ලබාදීමට කටයුතු කරලා තියෙනවා. එන්නත්කරණ වැඩසටහනේදි ඒ සඳහා සංග්‍රහ කටයුතු ලබාදීමෙන් සහ ප්‍රචාරණ කටයුතුවලින් සභාපතිතුමා උපරිම සහයෝගය ලබාදීලා තියෙනවා. අපේ මන්ත්‍රීවරු පවා විශාල කැප කිරීමක් කරල තියෙනවා. ඒ පිළිබඳව සියලු දෙනාටම මේ වෙලාවේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වගේම නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෛද්‍ය සභාව අනුමත කළ ප්‍රමාණයට, එන්නත සියලු දෙනාට ලබාදී අවසානයි.

ඒ වගේම මේ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක වන මොහොතේදී පවා රටේ සංවර්ධන වැඩපිළිවෙළ නවත්තලා නැහැ. නමුත් ග්‍රාම නිලධාරී වසමකට, රුපියල් ලක්ෂ 30 ක මුදලක් ලබා දෙනවා. ඒ් ලබා දෙන්නෙ පාරවල් හදන්න විතරක් නෙවෙයි. ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන අය ශක්තිමත් කරන්න. ඒ වගේම ගෙයක් දොරක් හදාගෙන වැඩ ඉවර කරන්න බැරි පුද්ගලයන්ට සහනයක් ලබා දෙන්න, වැසිකිලියක් නැති මනුස්සයට වැසිකිලියක් ලබාදෙන්න. ඒ වගේ ලොකු වැඩ පිළිවෙලක් මේ රජය විසින් ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වෙනවා. එක කොට්ඨාසයකට මුළු ගමේම ජන සභාව කැඳවලා, සියලු දෙනා එකතු කරගෙන, පන්සලේ හාමුදුරුවෝ, විදුහල්පතිවරුන්, මන්ත්‍රීවරුන්, සියලුම නිලධාරීන් සමග එකතු වී, යෝජනා එකතු කරගෙන, අපි බලාපොරොත්තු වෙනවා. ගමේ සෑම මනුෂ්‍යයෙකුටම සේවාවක් කරන්න. මේකෙදි අපේ මුදල් ඇමැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, නායකත්වය ගෙන විශාල කාර්යභාරයක් ඉටු කරනවා. ඒ වගේම

කාපට් ව්‍යාපෘති කිසිවක් නවත්තල නැහැ. අමාරුවෙන් හරි මේ රජය කරන්න පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් මේවා කරනවා. එක ග්‍රාම සේවා වසමකට ලක්ෂ 6ක ගෙයක් නිර්මාණය කර ගෙන යනවා. ඒ් නිසා මේ රජය නිසි වැඩපිළිවෙලක් කර ගෙන යනවා. ඒ වගේම රාජපක්ෂවරුන්ට චෝදනා කළාට, අපේ රට යුද්ධයෙන් ගලවගන්න වගේම, කොරෝනා වසංගතයෙන් ගලවගන්න එතුමන්ලා යම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරගෙන යමින් පවතින බව තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. ඒ වගේම අපේ ගරු ලේකම්තුමියට සහ නිලධාරීන්ට අපේ විපක්ෂ නායකතුමා රතු එළියක් නිකුත් කළා. මේ සභාව තුළ දී නීත්‍යානුකූල ලෙස කරන සෑම දෙයක් වෙනුවෙන්ම මේ නිලධාරීන් වෙනුවෙන් සභාපතිතුමා ප්‍රමුඛ අපේ මන්ත්‍රී කණ්ඩායම පෙනීසිටිනවා. නමුත් යම් අවස්ථාවලදී, අප බලාපොරොත්තු වන දේ මේ සභාව තුළින් ඉටු වෙන්නේ නැහැ. නිලධාරි කොයිවෙලේ බැලුවත් පාරේ තොටේ දකින්න ලැබෙනවා. ඒ වගේම ආදාහනාගාර පාර කැපීම ඇප්තොප්වත්තෙ j.c.b. යොදා සුද්ද කිරීම, සංවර්ධන කටයුතු මම ගිය සභා වාරෙදිත් කිව්වා. මේ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන්න. කාට හරි කොන්ත්‍රාත් එක පවරන්න. එවිට සභාපතිතුමා බලාපොරොත්තු වන ආකාරයට ඒ අනුව ඉෂ්ඨ කලා නම්, මෙවැනි තත්ත්වයක් උදා වෙන්නෙ නැහැ. වගකීමක් තියෙන නිලධාරීන් තුන්දෙනෙක් සභාවෙ ඉන්නවා. තාක්ෂණ නිලධාරීන් දැනගන්න ඕන. දල ඇස්තමේන්තුවක් හදලා, සභාවට දාලා, එය අනුමත කරගෙන, ඒ අනුව වැඩ කරන්න. එවිට අපිත් අපහසුතාවයට පත් වෙන්නේ නැහැ. ඒ වගේම මේ ඔබතුමාගෙවත්, මගේවත්, මුදල් නෙවෙයි. මහජනතාවගේ මුදල්. මේ මුදල් යොදවන ආකාරය පිළිබඳ විවිධ අණපනත් තියෙනවා. ඒ අනුව කටයුතු කරන්න ඕන. ලිපිගොනුවක් ගත්තම එහි පිලිවෙලක් තියෙන්න ඕන. මිනිට් ශීට් එකක් ගහලා, අද සභාවේ සිදුවුන දේවල් ඔඩිට් එකෙන් ඇවිල්ලා චෙක් කරන්න පුළුවන්. එවිට, ඒ ලිපිගොනු ටික හරියට නැති වුනහම අපටත් ඒ පිළිබඳ අධිභාරයක කොටසක් එනවා.

ඒ වගේම 50% 25% කියලා රාජකාරියට ගෙන්වනවා. අද වැඩට එන කණ්ඩායම මෙන්න ඊළඟ කණ්ඩායම කියලා මම මෙතනින් ඒ දේ දැක්කේ නැහැ. එතකොට මේ තරම් අතිකාල ප්‍රමාණයක් මොකද? යම් යම් කටයුතු අඩාල වෙනවා. ඒ නිසා පැමිණීම, පිටවීම පොත බලන්න. ක්‍රමවේදයක් තියෙනවා. පැමිණීම පිටවීම සටහන් කිරීමේදී අදාළ ක්‍රමවේදයට සිදු කරලා නැහැ. සභාව විවේචනය කරනවා නෙවෙයි. මේ අඩුපාඩු හදාගන්න ඕන. සභාවට ඇවිල්ලා මුදල් ටිකක් අනුමත කරලා දීලා, යනවා නෙවෙයි. මේක හදාගන්න. ඒ අඩුපාඩු පෙන්නලා දෙන්න ඕන. ඒ වගේම සභාවෙන් අනුමත කරලා තියෙන කිසිම දෙයක් කරන්න ලේකම්තුමිය බයවෙන්න එපා. මොකද මේ සභාවෙන් සියළු වගකීම අරගෙන තියෙන්නේ. එනිසා ගොනු ටික පිලිවෙලකට ලියල තියන්න. නීත්‍යානුකූල ලියකියවිලි, සභාවට අයත් ලොකු ප්‍රදේශයක් තියෙනවා. ඒවායේ ලිපි ලේඛන, නිවැරදිව තියෙන්න ඕන. ඇවිල්ල බැලුවම ඒවා මොකුත් නැහැ. ඒව පිළිවෙලකට හදාගන්න. හරියට වැඩ කරන්න. ෆයිල් වල මිනිට් ශීට් නැහැ. ගම්සභා කාලයේ ගැසට් කරපු පාරවල් ටික ඇරෙන්න, මේ කාලේ ගැසට් කරපු පාරවල් එකක්වත් නැහැ. ඒ වගේම ලොකු විප්ලවීය වෙනසක් රටේ වෙලා තියෙනවා. හැම පාරක්ම හැම වීදියක්ම පෝන් එකෙන් බලාගන්න පුළුවන් කම තියෙනවා. එයින් සභාවට අයත් පාරක්වත් වීදියක් වත් මේ වන තෙක් ගැසට් කරලා නැහැ. එනිසා ලොකු අඩුවක් තියෙනවා පළමුව මේ සඳහා නිලධාරියෙක් පත් කරලා, පාරවල් ටික ගැසට් කරලා, පාරවල් ටික පවර ගන්න. මේ සභාව නිවැරැදි දිශාවට ගමන් කරන්න සියලු දෙනාම සහයෝගය දෙන්න අවශ්‍ය වගේම, මේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් සභාවට ඇවිල්ලා, නැවත ඊළඟ සභාවට එන්න කලින්, ඇවිත් සභපතිතුමත් එක්ක සාකච්ඡා කරන්න. මෙතන වෙන්නේ මොකක්ද කියලා හොයලා බලන්න. ඒක නිලධාරීන්ට ලොකු ශක්තියක්. මෙතන ලී බඩු ප්‍රදර්ශනාගාරයක් කරන්න එපා. කණ්ඩායමක් ලෙස වැඩ කරන්න.ඌරල ප්‍රදේශයේ පතිනායක මන්ත්‍රීතුමා ශෝකය පළ කළා. විජේපාල ගුරුගමගේ මහතා නිහතමානි දේශපාලකයෙක්. එතුමා අප අතරින් වෙන් වීම සම්බන්ධව මම ශෝකය පළ කරන අතර, සභාවේ නිලධාරීන්ට සභාවේ හොඳ වැඩ කරන්න ලැබේවායි, ආශිර්වාද කරමින්, මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මුලින්ම ලක්රුවන් මන්ත්‍රීතුමාට ස්තුති කරන්න ඕන. සභාවෙ දියුනුවට කිසිම මන්ත්‍රීවරයෙක් කතා කරල නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මොකක් හරි ප්‍රශ්නයක් අල්ලගෙන කතා කලාට, සභාවේ දියුනුවට, හා අපටත් අවබෝධ වන විදිහට ඉතාමත් හරබර කතාවක් ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ, හොඳ වැඩ වලදී අපි හැමදාම මේ නිලධාරීන් සමග ඉන්නවා. හැබැයි අර කියපු අඩුපාඩු හදාගන්න ඕන. ඔබතුමා මේ අවුරුද්ද මුලදී සෑම කොට්ඨාසයකටම ලක්ෂ දෙකක මුදලක් දෙනවා කියලා යෝජනාවක් ආවා. 2021.01.31 මම මේ ලියුමට කලින් යෝජනාව ඉදිරිපත් කලේ. ඊට මාස 3කට කලින් ඇටඹගහවිල දොලේකඩේ පිවිසුම අසල පාලම ඉදිකර ගොවිජන සේවා මධ්‍යස්ථානයට සපත්තු පාලමක් හදන්න අවසර ඉල්ලලා ලියුමක් යැව්වා. කැමැත්ත ප්‍රකාශ කරල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලියුමක් ඇවිල්ල තියෙනවා. දෙවන ලියුම යනවා. ප්‍රාදේශීය ලේකම් කායාීලයට ඇටඹගහවිල, පුස්සැල්ලකාර මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධවයි කියලා. නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසර ඉල්ලලා, ලියුමක් යවනවා. මොන නිලධාරියා ද මේ වැඩ සම්බන්ධව කටයුතු කරන්නෙ. මේ කාර්යය සම්බන්ධයෙන් ඔබතුමාට මුදල් නිදහස් කරපුවා එවලද? මේ වැඩ සම්බන්ධව ඔබතුමා සොයා බලනවද? ඔබතුමා මේ සම්බන්ධව සභා වාර කිහිපයක කතාකරලා ඇති. මේ ලිපි දෙක අද මම අරන් ආවා. මේ ලිපි දෙකට අමතරව ලිපි රාශියක් තියෙන්න ඕන. මේ මාර්ග දෙකට චෝදනාවක් ආවා නම්, මම අතින් සල්ලි වියදම් කරලා, බෝර ගහලා, වැඩ අවසන් කරලා ඉවරයි. ඔබතුමාලට මේවා කරන්න බැරි නම් හේතු දක්වන්න.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඒ වැඩ වලට මුදල් පාස් කරලා ඇත්තේ. ඔබතුමා ඒ සම්බන්ධව ඉන්න නිලධාරීන්ගෙන් ඒ සම්බන්ධව සොයා බලන්න. අඩුපාඩු තියෙනවා නම් විතරක් කියන්න.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මෙහෙම වෙන්නේ නෑ සභාපතිතුමනි. ඔබතුමා අනුමත කරල දෙනවා. නමුත් මෙතනින් මේ කර්තව්‍යය සිදු වෙන්නේ නැහැ. කරපටුව මාර්ගයේ වතුර බස්සන්න බෝක්කුවක් දාන්න මට සල්ලි නැහැ. මේ මුදලින් බාගයක් හරි දෙන්න. මගේ අතින් 7500.00 ක් වියදම් කරළා හදලා දුන්නා. මේකට බැරි හේතුව අහල බලලා මට ලිඛිතව පිළිතුරක් දෙන්න. මේ වැඩකටයුතු කරගන්න බැරි තත්වයකට පත් වෙලා. මොකද මම පස් ගෙනිහිල්ලා පාරේ දාලා තියාගෙන ඉන්නවා. අන්තිමට අපට මේකෙන් අයින් වුණාට පස්සේ, චෝදනාව පමණයි අපට එන්නේ. මොකද මේ ප්‍රතිපාදන ලැබුනම ප්‍රතිපූර්ණය කර ගැනීමේ බලාපොරොත්තුව මත මගේ අතිනුත් රු. 25000.00, 30000.00 ක් පමණ වියදම් කළා. මේ පිළිබඳ අවධානය යොමු කරන්න.

ඒ වගේම වසන්ත මන්ත්‍රීතුමා ගිය සභාවේදීත් චෝදනා කළා. මේ රටේ සංවර්ධනය අඩාල වෙලයි කියලා. ඇත්තටම සතුටු වෙන්න ඕන. රටේ මෙච්චර වියසනයක් තියෙද්දි, රාජ්‍ය නිලධාරීන්ට පඩි ගෙවද්දි, මේ කටයුතු මේ ආකාරයෙන් ඉටු කිරීම ගොඩක් වටිනවා. මගේ කොට්ඨාසයේ පළමු හා දෙවන එන්නත ලබා දීලා තියෙනවා. මේ ප්‍රදේශයේ එන්නත්කරණය සාර්ථකව කරල තියෙනවා. ඒ

වගේම ගරු සභාපතිතුමනි, 17 වැනි දා උදේ 9.00 ට කැටගොඩ කඩේ අසල මාර්ගය කිලෝමීටර් 3.4ක් තුන්කෝටි හාර ලක්ෂයක් පාස්වෙලා තියෙනවා. අපේ ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා. මොකද මේ මාර්ගය සංවර්ධනය සම්බන්ධයෙන් එතුමාටත් ලොකු වුවමනාවක් තිබුණා. මට මතකයි ඔබතුමා ඒ කාලේ පොල් ගස් උඩ නැඟලා, උපවාසයක් කලා. අද වෙනකන් හදාගන්න බැරිව තිබුණු මාර්ගය සම්බන්ධ මම සතුටු වෙනවා. සම්පත් අතුකෝරල මැතිතුමා ගේ දායකත්වයෙන් මේ මාර්ගය ආරම්භ කිරීම සම්බන්ධව. ඒ වගේම ගමේ මන්ත්‍රීවරයා වශයෙන් එම ස්ථානයට පැමිණෙන්න කියලා, ඔබතුමාට මම ආරාධනා කරනවා.

ඒ වගේම කාබනික පොහොර පිළිබඳව කතා කළා. දලු වල ආදායම අඩු වෙලා තියෙනවා. ඒ දුවපු දිවිල්ලට ආදායම අහිමි වෙලා තියෙනවා. එය අහිමි වුනත්, අපට ඉදිරි පරම්පරාවට වන යහපත ගැන හිතන්න ඕන. සම්පත් අතුකෝරල මැතිතුමා, නයිට්‍රජන් 12% පමණ පොහොර ගෙන්වීමට අවසර දීලා තියෙනවා කියලා දැනුවත් කළා. ඒ නිසා ඉදිරියේදී හෝ දළු ව්‍යාපාරය යම්තාක් දුරකට පෙර තිබු තත්වයට ගෙන යාමට හැකිවේවි. ගොවිජන සේවා වලින් අප ප්‍රදේශයේ කාබනික පොහොර ව්‍යාපෘති ඉතා සාර්ථකව කරගෙන යනවා. ඒ වගේම මගේ ප්‍රදේශයේ මේ වැඩ පිළිබඳව නිලධාරීන් දැනුවත් කරලා ඉතා ඉක්මනින් එම මුදල් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

පසුගිය දිනවල කොරෝනා එන්නත ලබා දීමේදී, අපේ ප්‍රදේශයට ඉතාම සාර්ථක ලෙස එන්නත ලබා දුන්නා. එයට සහභාගි වූ සියලුම රාජ්‍ය නිලධාරීන්ට ස්තූතිවන්ත වෙනවා. අප කොට්ඨාසයේ මන්ත්‍රීතුමිය කතා කළා. එම අවස්ථාවේදී තමයි මම දැනගත්තෙ, මෙම ග්‍රාම නිලධාරීන්ට මුදල් ගෙවන්න ඕන කියලා.

ඒ වගේම පසුගිය දිනවල අප අතරින් වෙන්ව ගිය විජේපාල ගුරු ගමගේ මැතිතුමා ජනතාවට සේවය කළේ ඉතාමත් හොඳින්. ඒ කාලය අමාරු කාලයක්. ගෙයින් ගෙට පයින් ගොස් තමයි ඔහු සේවය කළේ. ඔහු ඉතා ජනප්‍රිය පුද්ගලයෙක්. එතුමන්ගේ වියෝව ගැන මම මේ අවස්ථාවේදී සංවේගය පළ කර සිටිනවා. ඒ වගේම වනමල් මන්ත්‍රීතුමා, මේ සභාවෙන් එතුමන් වෙන්ව යනවා කියලා ප්‍රකාශ කළා. ඒ සම්බන්ධව කනගාටුව ප්‍රකාශ කරන අතර, එතුමා එන්නත්කරණය සම්බන්ධව මහා භීතියක් මවා පෑවා. එතුමන්ගේ මිනිස්සු කැමති ඇත්තේ මේ එන්නත නොවිද, මෙතන විශාල පිරිසක් ජීවිතක්ෂයට පත් වෙනවා දකින්න වෙන්න ඇති. මේ එන්නත දුර්වල කරන්න විශාල ප්‍රචාරයක් යනවා. ඒකට කවුරුවත් අහුවෙන්නෙ නැහැ. ඒ වගේම සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

අපිත් සමග 1991 වර්ෂයේ එකට තේරීපත්වූ මන්ත්‍රීවරයෙක් තමයි විජේපාල ගුරුගමගේ මහතා. එතුමන් ඉතා නිහතමානී චරිතයක්. එතුමන්ගේ වියෝව වෙනුවෙන් අපගේ සාතිශය සංවේගය පළ

කර සිටිනවා. එතුමා 1991 වර්ෂයේ පළමු මැතිවරණයට තරඟ වැදුනේ. එතුමාට මනාප ඡන්ද ලයිස්තුවට එන්න ලැබුණේ නැහැ. 9 වන ස්ථානය ලැබුණේ. අපගේ අභාවප්‍රාප්ත ආරියතිලක මැතිතුමා වෙනුවට තමයි මෙතුමා එක්ක 1993 ප්‍රාදේශීය සභාවට පැමිණුනේ. ඒ වගේම එතුමත් එක්ක එකට හිටපු මන්ත්‍රීවරයෙක් තමයි මම. කොවිඩ් වසංගත තත්ත්වයක් නොමැති වූවා නම්, නියතවශයෙන්ම එතුමාගේ දේහය ගෙනැල්ලා, උපරිම ගෞරවය, සංවේගය පළ කරන්න තිබුණා. නමුත් එවැනි දෙයක් අපිට කරන්න බැරිවීම ගැන කනගාටුවට පත් වෙනවා. ඒ බවත් මේ වෙලාවේ සිහිපත් කරනවා. අපේ වනමල් මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදුකර තිබුණා. එතුමාගේ මන්ත්‍රීධුරයත් අහෝසි කරලා තියෙනවා. එතුමා ගැනත් අපට ආරංචියි. ඒ වගේම එතුමා අපට හිටපු සමීප දේශපාලකයෙක්. එතුමා ගත් මේ තීරණය, ක්‍රියාමාර්ගය දිගටම ඉදිරියට කරගෙන යන ලෙස ඉල්ලමින්, ඒ වගේම තරංග මන්ත්‍රීතුමා, වනිගරත්න මන්ත්‍රිතුමා, සමන් මන්ත්‍රිතුමා සඳහන් කළ පරිදි, හෝමදොල වත්ත සම්බන්ධ ජල මූලාශ්‍ර ප්‍රශ්නය අතර මග නතර නොකොට, ඉදිරියටම එය යම් විසඳුමක් ලැබෙන තෙක් කරගෙන යන ලෙස ඉල්ලමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු මන්ත්‍රීවරුනි ගරු මන්ත්‍රිනි ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කළ ලිපිය, ලිපි ඉදිරිපත් කරන අවස්ථාවේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට නොහැකි වුණා. එය මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා. එහි අන්තර්ගතව තියෙන්නේ, සභාවට පාරක් පවරා ගැනීම සම්බන්ධව. එවැනි ඉල්ලීම් මේ වන විට කිහිපයක්ම මන්ත්‍රීවරුන් විසින් සභාවට ඉදිරිපත් කර තිබෙන බැවින්, මේ සියල්ල ඉදිරියේදී නීත්‍යානුකූල පවරා ගැනීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ සමගම මෙම ගරු සභාවට 1993 වසරේ මහජන නියෝජිතයකු වශයෙන් පත්වී වසර හතරක පමණ කාලයක් ගරු සේවයක් කළ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේපාල ගුරුගමගේ මැතිතුමාගේ අභාවය පිළිබඳව සභාවට ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින්, එතුමා පිළිබඳව යමක් ප්‍රකාශ කිරීම වර්තමාන සභාපති හැටියට මගේ යුතුකමක්. මෙතුමා මා හඳුනාගත්තේ දේශපාලනයට ඒමට ප්‍රථම මාගේ පියාණන්ලා සමග කුළුපග මිතුරෙකු හැටියට, එදා මෙම ප්‍රදේශයේ සිටිය ගෞරවනීය දේශපාලන චරිතයක් තමයි හිනිදුම ආසන හිටපු මහජන නියෝජිත හෙන්රි දිසානායක මැතිතුමා. එතුමාගේ පියා මෙම ගරු සභාවේ ගරු සභාපති හැටියට කටයුතු කළ අයෙක්. මගේ පියාත්, පියාගේ සහෝදරයාත් හෙන්රි දිසානායක මන්ත්‍රීතුමාලත් බොහොම මිත්‍රශීලී සමාජ සේවකයන් මෙන්ම හිතවත් අය. හෙන්රි දිසානායක මහතාගේ ගම ඌරල. අපි අද ශෝකය ප්‍රකාශ කරන විජේපාල මහතාත් ඌරල. මේ දෙපළත් එකට දේශපාලන ගමන් මගක ගිය අය. මේ අනුව එකම දේශපාලන මත දරන අය වශයෙන් තමයි මේ සියලු දෙනා දැන හඳුනාගත්තේ. ඒ අනුව තමයි මාගේ පියා සමග විජේපාල මහත්මා සුහද වන්නේ. ඒ ඇසුර තුළ මම ඔහුව හඳුන ගත්තා. පසුව වර්තමාන දේශපාලන ක්‍රියාවලියේ දී ඉතාම ළඟ ඇසුරක් මා සහ එතුමාගේ පවුල් අතර ඇති වුනා. ඒ බැඳීම තුළ විජේපාල හිටපු මන්ත්‍රිතුමාගේ ඇසුර ලබන කොට මමද ඔහුගෙන් යම් යම් දේවල් ඉගෙන ගත්තා. ඔහු හොඳ දැක්මක් තිබුණු සමාජ සේවකයෙක්. එතුමා යම් අසනීප තත්ත්වයක සිටිය නිසා වර්තමානයේ ඇතිව තිබෙන කොරෝනා වසංගතයට ගොදුරු වන්නට සිදු වුණා. අවසන් කටයුතු සෞඛ්‍ය නීතිරීති අනුව සිදු වූ නිසා, අප කිසිවෙකුට අවසාන කටයුතු සඳහා සහභාගිවීමට නොහැකිවීම පිළිබඳව අප තුළ ඇත්තේ කණගාටුවක්. මම සභා ලේකම්වරියට යෝජනා කරනවා. අපගේ සභාවේ වූ ශෝක යෝජනාව විජේපාල මන්ත්‍රීතුමාගේ පවුලේ අයට යැවීමට කටයුතු කරන්න කියලා.

ගරු මන්ත්‍රීවරුනි, ඉතා අසීරු කාලවකවානුවක තමයි අපිට ජීවත්වෙන්න සිදුවෙලා තියෙන්නේ. නමුත් අපි මේ සියලු උවදුරු පිළිබඳව සිත සිතා ඉන්නවට වඩා, අපෙන් සමාජයට සිදුවිය යුතු කාරණා පිළිබඳව උනන්දුවීම වැදගත් කොට සළකලා, පසුගියදා ඔබ සියළු දෙනා දැනුවත්ව සිටි

ආදාහනාගාරයේ සහ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමේ කටයුතු සිදුකළා. ගරු මන්ත්‍රීවරුනි  මෙම සංවර්ධන යෝජනා දෙක පිළිබඳව අද දින ගරු මන්ත්‍රීවරුන්ගෙන් යම් යම් අදහස් පළ වූ බැවින්, මෙහි අතීත ඇරඹුම පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීම මගේ යුතුකමක් වෙනවා

ගරු මන්ත්‍රීවරුනි, මම මෙම ගරු සභාවට මහජන නියෝජිතයෙකු වශයෙන් පත්වී ආවේ 2002 වර්ෂයේ. එදා මම දැකපු අඩුව තමයි අපේ සභා බල ප්‍රදේශයේ ආදාහනාගාරයක් නොමැතිවීම. මේ පිළිබඳව සොයා බැලීමේදී, ඊට ප්‍රථම සිටිය ගරු සභාපතිවරුන් මේ පිළිබඳව උනන්දු වුවත්, සමාජ විරෝධතා සහ ස්ථාන සොයා ගැනීමේදී සහ මූල්‍ය ප්‍රතිපාදන සොයා ගැනීමේ දී සිදු වූ අපහසුතාවයන් නිසා, මේ පිළිබඳව ඉදිරි පියවර ගැනීමට උනන්දු වුනේ නැහැ. නමුත් මම මේ පිළිබඳව එදා සිට අද දක්වාම පසුව පත්වූ ගරු සභාපතිතුමන් ලා සමග මෙම අවශ්‍යතාවය පිළිබඳව පිළිබඳව සාකච්ඡා කෙරුවද, ඉහත සඳහන් කරුණු බාධාවක් වූ බැවින්, අපගේ උත්සාහය අසාර්ථක වුණා. නමුත් මන්ත්‍රීවරුනි, මම මේ ගරු සභාවට  2018 වර්ෂයේදී සභාපතිධූරයට පත් වූ පසු, මාගේ ප්‍රථම කතාවේදී මම ප්‍රකාශ කළා. කෙසේ හෝ අපගේ සභාවට අවශ්‍ය ආදාහනාගාරය ප්‍රමුඛ අදාළ අනෙකුත් සංවර්ධන කාර්යයන්, මාගේ ශක්ති ප්‍රමාණයෙන් ඉටු කිරීමට උත්සාහ ගන්නා බව. එය හිතේ ධාරණය කරගෙන තමයි එදා මධ්‍යම රජය එක්සත් ජාතික පක්ෂය සතුව තිබුනත්, එම රජයේ ප්‍රධාන අමාත්‍යධූරයන් වන, පළාත් පාලන ස්වදේශ කටයුතු සහ ඉඩම් අමාත්‍ය ධූරය යන දෙකම අපි දන්නා අමාත්‍යවරුන් දෙදෙනෙකු සතුවීම. ඔවුන් තමයි ගරු වජිර අබේවර්ධන හිටපු ඇමතිතුමා සහ ගරු ගයන්ත කරුණාතිලක හිටපු ඇමතිතුමා. එතුමන්ලා දරන දේශපාලන මතයත්, මම දරන දේශපාලන මතයත් දෙකක් වුවත්, එතුමන්ලා දෙදෙනා හමු වීමට ගොස් අපගේ අවශ්‍යතාවය ඉදිරිපත් කළා විට, එතුමන්ලා නොපැකිළව මට උදව් කිරීමට කැමැත්ත ප්‍රකාශ කළා. ඒ අනුව අවශ්‍ය ඉඩම ගැනීමට ගයන්ත ඇමැතිතුමා සහ ආදාහනාගාරය ඉදිකිරීමට ඒ වන විට සාමාන්‍ය ඇස්තමේන්තුව වූ රුපියල් ලක්ෂ 200 ක මුදල  ලබාදීමට වජිර ඇමතිතුමාත් අවශ්‍ය කටයුතු සැලසුම් කළා. මේ කටයුතු සිදුවන අවස්ථාවේ තමයි එක්සත් ජාතික පක්ෂය රජය වෙනස් වී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ රජය පත්වුණේ. මේ වන විට අවශ්‍ය ඉඩම නීත්‍යානුකූලවම ලබා ගැනීම සිදු කරමින් තිබුණේ. නමුත් මුදල් ලබා දීම සිදු වන්නේ, එය නිසියාකාරයෙන් අපේ සභාවේ නමට තිබුණොත් පමණයි. මෙම ප්‍රමාදය නිසා  අපට මෙම මුදල් ලබාගැනීමට නොහැකි වුණා. තරංග මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට කටයුතු සිදුකිරීමට බැරිවුනේ එමනිසා. නමුත් පසුව පත් වුන අපේ රජය යටතේ, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ සෞභාග්‍යයේ දැක්මේ තිබෙන පළාත් පාලන ආයතන නගාසිටුවීමේ වැඩසටහන යටතේ වර්තමාන අපගේ ආසන සංවිධායක, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, සම්පත් අතුකෝරල මැතිතුමාගේ සහ දිස්ත්‍රික් නායක ගරු වැවිලි අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ ඇමැතිතුමාගේ උනන්දුව, ආශිර්වාදය මත තමයි වර්තමාන කටයුතු සිදු වන්නේ. විශේෂයෙන්ම මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕන. ගයන්ත ඇමැතිතුමා ඉඩම ලබා දුන්නත්, එය නීත්‍යානුකූලව ලබා ගැනීමට වර්තමානයේ ඉඩම් පරිහරණය කරන වතු සමාගම් වලින් ඉඩම් ලබාගැනීම ඉතාම අපහසුයි. (උදාහරණයක් හැටියට බද්දේගම ප්‍රාදේශීය සභාව මේ වන විට ඉඩම් ලබා ගැනීමට මුදල් ලක්ෂ ගානක් එම ආයතන වෙත ලබාදී තිබුණත්, තවම ඉඩම ලබා ගැනීමට බැරිවෙලා තියෙනවා) නමුත් අපට පුළුවන් වුණා. වර්තමානයේ වැවිලි අමාත්‍ය ධූරය දරන ගරු රමේෂ් පතිරණ ඇමැතිතුමාට කියලා වතු සමාගම සමග සාකච්ඡා කොට, ඉක්මනින් ආදාහනාගාරය ඉදි කිරීමට යෝජිත ඉඩම ලබා ගැනීමට. මේ සියලු දේවල් මේ විදිහට සිදු කරන විට, මා හට මෙම ඉඩම ලබාගැනීමට අවශ්‍ය  මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට, වර්තමාන දකුණු පළාත් ආණ්ඩුකාරවර ගරු විලී ගමගේ මැතිතුමා ප්‍රමුඛව කටයුතු කළා. එතුමා අපට යෝධ ශක්තියක්. වෙනදා වගේ නොවෙයි අපට ලැබෙන සියලුම මුද්දර ගාස්තු, දඩ මුදල් ආදිය මෙන්ම, ඊට පරිබාහිරව අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනවා. ඇප්තොප්වත්ත ඉඩමේ තක්සේරු මුදල් අපට ලබා දී තිබෙනවා. නමුත් මට මෙම  මුදල් අදාල ආයතන සමග කතා කොට, උපරිම අඩුවෙන් තක්සේරු කරගෙන තමයි මුදල් වියදම් කළේ. මෙම ඉඩම් ලබාගැනීමේදී, ඒ අවස්ථාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ

අධ්‍යක්ෂ ජනරාල් හැටියට කටයුතු කළ, වර්තමානයේ ගාල්ල මැතිවරණ කොමසාරිස් හැටියට කටයුතු කරන, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිසාපති හැටියට කටයුතු කළ චන්ද්‍රලාල් මැතිතුමා මට විශාල සහයෝගයක් දැක්වූවා පමණක් නෙවෙයි. අදාළ උපදෙස් ලබා දී මා උනන්දු කළා. එතුමා මගේ මේ ක්‍රියාදාමය අගය කරමින් කතා කළා. එතුමා මට කිව්වා සභාපතිතුමනි, ඔබතුමා තමයි පෞද්ගලික නොවන පොදු කාරණයකට ඉඩම් ලබා ගැනීමට පැමිණියේ කියලා. ඒ ගෞරවය මට ඇති. මේ පිළිබඳව වර්තමාන පළාත් පාලන කොමසාරිස් සේනක පල්ලියගුරු මැතිතුමා හොඳින්ම දන්නවා. එතුමාද අපිව උනන්දු කළා. ප්‍රධාන ඉංජිනේරු ජයනන්ද මැතිතුමා අවශ්‍ය ඉංජිනේරු සහය ලබා දෙමින්, අවශ්‍ය සම්පූර්ණ ඇස්තමේන්තු මුදල ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකළා. මේ සියලු දේවල් මෙසේ වෙද්දී, අමාත්‍යාංශ මට්ටමෙන් පූර්ණ සහය දැක්වූ නිලධාරීන් දෙදෙනකු සිටිනවා. ඒ තමයි අමාත්‍යාංශයට අලුතින් පත් වී ආ අතිරේක ලේකම්තුමිය සහ එදා සිට මුදල් අධ්‍යක්ෂ පුෂ්පකුමාර මැතිතුමා, මෙතුමා කලින් වජිර ඇමතිතුමාගේ කාලයේ දී මුදල් වෙන් කිරීමේදී ද, හිටපු නිලධාරීතුමා. එතුමා දන්නවා මා මේ සඳහා වෙහෙසුනු තරම. ඒ අනුව අදටත් එතුමා මාව උනන්දු කරවනවා. ඒ අනුව තමයි මුළු පලාත් පාලන ආයතන වෙනුවෙන් වෙන් ව තිබුණු මිලියන තුන්දාහෙන්, මිලියන 61 ක් වැනි මුදල් ප්‍රමාණයක්. (ආදාහනාගාරයට මිලියන පනස් එකයි වෙළෙඳ සංකීර්ණයට මිලියන දහයක් ආදී වශයෙන්) ලබා ගැනීමට හැකිවුණේ. මේ ගෞරවය අප කාටත් ලබාදිය යුතුයි. මන්ද අවශ්‍ය ලියකියවිලි මෙන්ම අනෙකුත් සහය ලබා දීමෙන් උනන්දු වුන අපේ ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලයේ තාක්ෂණ නිලධාරීන් ඇතුළු සේවක පිරිස. මම මේ සියලු කරුණු කාරණා ප්‍රකාශ කළේ ඔබතුමන්ලාගේ දැනුවත් වීමට. මම කෘතගුණ දන්නා මෙන්ම කුහක නොවන නිසා, අදටත් අපට මේ සඳහා උදව් උපකාර කළ මැති ඇමතිතුමන්ලා ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා වගේම අගය කරනවා. ඒ නිසා තමයි මම මුල්ගල් තබන අවස්ථාවේ මේ සියලු මැති ඇමතිතුමන්ලා දැනුවත් කලේ. නමුත් දැනුවත් කළ ආකාරය වෙනස් වුණේ මෙම මුල් ගල් තැබීම පිළිබඳව අප දැනුවත් වුණෙත්, මුල් ගල් තබන දිනට දින තුනකට කලින්. එයට හේතුව තමයි ලබාදී තිබෙන මූල්‍ය ප්‍රතිපාදන මේ වසර අවසන් වීමට ප්‍රථම අවශ්‍ය කාරණය වෙනුවෙන් යෙදවීම. එසේ බැරි වුවහොත් එම මුදල් ලබන වසරට අඛණ්ඩ නොවීමත් නිසා. ඒ අනුව තමයි අපට අමාත්‍යාංශ මට්ටමින් මෙම සංවර්ධන ව්‍යාපෘති හැකි ඉක්මනින් ඉටු කිරීමට උපදෙස් ලැබුණේ. ඒ අවස්ථාවේ මම අපේ සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමාට කතා කොට උපදෙස් ලබා ගත්තා. පසුව එතුමා ප්‍රකාශ කළා. 04 වන දින සීමිත ප්‍රමාණයක් රැස් කොට, ඒ කටයුතු කරන්න කියලා. ඒ අනුව තමයි මම සභාවේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකුට සහ සභාවේ ලේකම් තුමිය සමග සාකච්ඡා කොට 04 වන දින උත්සවය සංවිධානය කළේ. ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමා, ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා, ගරු අමාත්‍ය මොහාන් පී ද සිල්වා මැතිතුමා, ගරු මන්ත්‍රී ඉසුරු දොඩන්ගොඩ මැතිතුමා, හිටපු අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා, ප්‍රමුඛ මැති ඇමැතිවරුන්, පළාත් පාලන කොමසාරිස් ඇතුළු රාජ්‍ය නිලධාරීන්. සම්පත් අතුකෝරල මැතිතුමාගේ ආරාධනයෙන් පැමිණියා. මම දුරකථනයෙන් මෙන්ම වට්ස්ඇප් මාර්ගයෙන් මන්ත්‍රීවරු දැනුවත් කිරීමට කටයුතු කලා. ප්‍රාදේශීය සභාවේ හිටපු සියලු සභාපතිවරුන් මෙන්ම, මන්ත්‍රීවරු ද දැනුවත් කළා. අමතක වීමකින් හිටපු මන්ත්‍රී දෙපළකට ආරාධනා කිරීමට බැරි වුණා. ඒ අතර උත්සව සංවිධානය කිරීමට අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකු සම්බන්ධ කරගත්තා. ප්‍රියන්ති මන්ත්‍රීතුමිය, සුභාෂි මන්ත්‍රීතුමිය, පියල් මන්ත්‍රිතුමා, ගයාන් මන්ත්‍රීතුමා, ලක්රුවන් මන්ත්‍රිතුමා, ධර්මසිරි මන්ත්‍රිතුමා වෙත භාරදුන්නා. ඵලක සෑදීම, වැඩ බිම හා සංග්‍රහ සංවිධාන කටයුතු ආදියට මෙන්ම සුභාෂි මන්ත්‍රීතුමිය ක්ෂණික ආරාධනා පතක් සකස් කොට වට්ස්ඇප් මාර්ගයෙන් මන්ත්‍රීවරු දැනුවත් කළා. මම පෞද්ගලිකවම වජිර ඇමතිතුමාට, ගයන්ත ඇමතිතුමාට, පියසේන ගමගේ හිටපු ඇමැතිතුමාට, විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට, නිශාන්ත මුතුහෙට්ටිගම හිටපු ඇමතිතුමා, සුනිල් සේනානායක හිටපු මන්ත්‍රීතුමා, අපේ පළාත් සභා මන්ත්‍රීවරුන් වන චම්ලි විතානාච්චි මැතිතුමා, සිසිර කුමාරරත්න මැතිතුමා, සිල්වා මැතිතුමා, දුල්ෂාන් කාරියවසම් මැතිතුමා ආදීන් හට දුරකථන

මාර්ගයෙන් ආරාධනා කළා. මම කිව්වේ රටේ තියෙන තත්ත්වය අනුව පැමිණීම බලාපොරොත්තු වුණත්, සෞඛ්‍ය හේතු මත ආශිර්වාදය පමණක් තිබුණත් ඇති කියලා. සමහරවිට ආරාධනා කිරීමේදී යම් යම් අතපසුවීම් වන්නට ඇති. සහබන්දු මන්ත්‍රීතුමාට ආරාධනා කරද්දී, ඒ බැව් ප්‍රකාශ වුණා. නමුත් ඔබතුමාගේ සිතිවිල්ල නිවැරදි නොමැති බව මම ප්‍රකාශ කරනවා. නමුත් මගේ ආරාධනා කිරීමේදී, යම් අතපසුවීමක් වූවානම් කණගාටුව ප්‍රකාශ කරනවා.

මන්ත්‍රීවරුනි, මේ සියලු දේවල් සිදු කිරීමේදී අපට යම් පිරිවැයක් දැරීමට සිදුවුණා. එලක සැදීම, පැමිණි අමුත්තන්ට සංග්‍රහ කිරීම, ඇතුළු මඩු පුටු ආදිය සඳහා මම ඉදිරිපත් කළ වියදම් ඒ සඳහා වියදම් වූ ඒවාය. මම බලාපොරොත්තු වෙනවා එම මුදල් කොන්ත්‍රාත්කරුවන් සමග සාකච්ඡා කොට ප්‍රතිපූර්ණය කර ගැනීමට. මෙම සියල්ල මෙසේ සිදු වුවත්, මම කනගාටුවෙන් වුනත් ප්‍රකාශ කරනවා. මෙම ඉදි කරන ආදාහනාගාරය සහ වෙළෙඳ සංකීර්ණය තියෙන ස්ථානයවත් නොදන්නා මන්ත්‍රීවරු පිරිසක් මෙම සභාවේ සිටින බව. මම එතුමන්ලාට කියනවා. තමන්ගේ සභාවේ ඉදිවන මෙම සංවර්ධන ක්‍රියාදාමයන් ගැන සොයා බලන්න කියා. මීට වඩා මේ පිළිබඳව මං කතා කරන්නේ නැහැ.

මම දැන් කතා කරන්නම්. මේ වන විට සමස්ත රටේ ඇති වී ඇති අර්බුදයන් පිළිබඳව. කතා කළ සමහර මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වුන පරිදි බඩුමිල සහ බඩුවල හිඟතාවය පිළිබඳව කතා කළොත්, ඔබ සියලු දෙනා දන්නවා. අද ලෝකයේ තත්ත්වය. පවතින ලෝක වසංගතය තුළ වුව ද, අපේ රටේ සංවර්ධන ක්‍රියාදාමයන් නවත්වලා නැහැ. ඔබතුමාලා දන්නවා මේ වන විට ගමකට රුපියල් මිලියන දෙක බැගින් මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා ලබාදීමට ඇස්තමේන්තු සකස් කරලත් ඉවරයි. කටුමැටි ගෙවල් සඳහා නව නිවසක් තනා ගැනීමට ලක්ෂ 6ක ආධාර ලබාදීම, කාපට් මාර්ග ලක්ෂය ව්‍යාපෘතිය යටතේ අප බල ප්‍රදේශයේ මාර්ග කිලෝමීටර් 50ක පමණ ප්‍රමාණයක් කාපට් කිරීම අරඹා තිබීම ආදිය නිදසුන් හැටියට පෙන්වා දෙන්න පුළුවන්. මේ සියලු දේ අතරේ වසංගත තත්වය නිසා අසරණ වූ පවුල් සඳහා රුපියල් පන්දාහ ගානේ මුදලක් ලබා දීම, රෝගය වැළඳුණු පවුල් සඳහා රුපියල් දහදාහක සහන බඩු මල්ලක් ලබා දීම, මේ වන විට නොකඩවා කර ගෙන යන වැඩසටහන්. ඒ අතරේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට පුළුවන් වුණා රටේ සමස්ත ජනතාවගේ 50% කට වඩා වැඩි ප්‍රමාණයකට කෝවිඩ් එන්නත ලබාදීමට. ලෝකයේ කොවිඩ් පාලනය කිරීම සම්බන්ධයෙන් ඉදිරියෙන් සිටින රටක් හැටියට අපේ රට නම් වුණා. නමුත් ජනතාවගේ නොමනා හැසිරීම් රටාව නිසා අපි බලාපොරොත්තු ආකාරයට කොවිඩ් රෝගය පාලනය කිරීමට අපහසු වී තිබෙනවා. අපි කවුරුත් එකතුවෙලා මෙම ව්‍යසනයෙන් ගොඩ යන්න සැරසෙමු කියා මම සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා. අපේ සභාවේ මන්ත්‍රීවරුන් මෙන්ම නිලධාරීන්, සේවකයන් නිරෝධායනය වීමට ලක් වුණා. මේ කතා කරන මම ද කොවිඩ් රෝගයට ගොදුරු වුණා. නමුත් එන්නත්කරණය ලබාගෙන තිබූ නිසා ඉක්මනින් සුවය ලැබුවා. ඒ වගේම බඩු මල්ල ගැන කතා කළා. මට ද එම සහනාධාරය ලැබුණා. නමුත් මම සතුටින් නැවත එය ලබා දුන්නා. මෙම සහනාධාරය සියලු නිරෝදායනය වන අයට ලබා දෙනවා. සභාවෙන් ලබා දුන් සහන බඩු මල්ල ලබා දුන්නේ රෝගය වැළඳුණු හෝ තම නිවසේ රෝගියෙක් සිටියොත් පමණයි. නිරෝධායනය වූ පමණින් අපි ඒවා ලබා දුන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා දන්නවා මුළු දකුණු පළාතට වසරකට රජයෙන් ලබා දෙන මුදල රුපියල් බිලියන 33 යි. එයින් බිලියන 30 ක් පඩි නඩි ආශ්‍රිතව. බිලියන තුනක් සංවර්ධන ක්‍රියාදාමයට. නමුත් මෙම වසරේ කොවිඩ් වසංගතය වෙනුවෙන් වියදම බිලියන තුන්සීයයි. මේ අමතර වියදම, අපට සංවර්ධනය ලබා දීමට තිබූ මුදල් නේද? ඉතින් බඩු මිල ඉහළ යෑම, හිඟවීම, නතර කිරීමට පුලුවන්ද? අපිට වඩා ආර්ථික අතින් දියුණු රටවල් වලත් මේ ආනිසංසම තමයි. අපි ඉවසමු. තව වසරකින් දෙකකින් ඔබතුමන්ලා ම කියාවි දැන් ගන්නා ක්‍රියාමාර්ග නිසා අපි බේරුණා කියලා. මන්ත්‍රීවරුනි මෙහි අතුරු ඵලයක් ලෙස තමයි පියල් මන්ත්‍රිතුමා තමන්ට වූ අපහසුතාවය පිළිබඳව සභාවට පැහැදිලි කළේ. මම මේ පිළිබඳව පොලිස් ස්ථානාධිපතිතුමා ගෙන් විමසා පිළිතුරක් ලබා දෙන්නම්. මේ පිළිබඳව පියල් මන්ත්‍රිතුමා එදින වූ

සිද්ධිය මා සමග වාචිකව පැවසුවා. ජනතා විමුක්ති පෙරමුණේ ජයවීර මන්ත්‍රීතුමාත් අද ප්‍රකාශ කලෙත් ඒකමයි. ඉතින් මම හිතනවා මෙම සිද්ධිය සත්‍ය වෙන්න ඇති කියා. මම සභාපති හැටියට මධ්‍යස්ථව බලන්න ඕන. ඒ වගේම ගරු මන්ත්‍රීවරුන්ගේ ගෞරවයත් ආරක්ෂා කළ යුතුයි. ඒ අනුව ඉදිරියේදී මේ ගැන සාධනීය පියවරක් ගැනීම කරනවා. ධනංජය මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ පරිදි කොරෝනා රෝගීන් ප්‍රවාහනය සහ p c r පරීක්ෂණ කිරීම සඳහා අවශ්‍ය වාහනයක් ලබා ගැනීම අපහසු වී ඇත්තේ, මේ සඳහා ඉදිරිපත් වන අය නොමැති නිසා. ඔබතුමා සඳහන් කළ අය මගෙන් විමසුවා. වාහනය දෙන්නම්. වාහනය සෑදීමට මුදලක් යනවා මොකද කරන්නේ කියලා. ඉතින් මම කිව්වා මුදල් ගෙවන ආකාරය පිළිබඳව මට හරියටම ප්‍රකාශ කරන්න හැකියාවක් නැහැ කියලා. ඒ නිසයි එම වාහනය ප්‍රමාද. මේ පිළිබඳව ඉදිරියේදී සොයා බලන්නම්.

තවද ගරු මන්ත්‍රීවරු කිහිප පළක් ප්‍රකාශ කළ, උඩුගම හෝමදොල වත්ත ආශ්‍රිත ජල මූලාශ්‍ර ප්‍රදේශ පිළිබඳව සොයා බලා අදාල වතු සමාගම දැනුවත් කිරීමට පියවර ගන්න කියලා. ඒ වගේම ගරු උප සභාපතිතුමා පෙන්වා දුන් නාකියාදෙණිය කටුපොල් කර්මාන්ත ශාලාවෙ අපද්‍රව්‍ය මාමනදොළ ඇළට මුදා හැරීම පිළිබඳව. මීට ප්‍රථම කිහිපයකම සොයාබැලීම් සිදුකළා. නීත්‍යානුකූල පියවර ගත්තා. නමුත් මට පේන විදියට මෙම වතු සමාගම ඒ කිසිවකින් සෑහීමකට පත් නොවන බව, මම මේ සම්බන්ධව ලිඛිතව වතු සමාගම දැනුවත් කර පිළිතුරක් ලබා ගන්නා ලෙස ලේකම්තුමියට පවරනවා. ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමා බොහෝ කරුණු කාරණා අද සභාවේ ප්‍රකාශ කළා. ඒ සියලුම දේවල් මම අනුමත කරනවා. අප සියලු දෙනා දන්නවා ප්‍රාදේශීය සභා පාලනය, වෙනත් ආයතන පාලනයත් එකකට එකක් වෙනස් බව. ඒ අනුව තමයි විශේෂ නිලධාරියෙක් හැටියට ප්‍රාදේශීය සභා ලේකම් කෙනෙකු ඉන්නේ. එම නිලධාරියා තමයි සභා නිලධාරීන් අවශ්‍ය උපදෙස් දීම, වැඩ පැවරීම සිදු කරන්නේ. ඒ සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාගෙන තමයි ලේකම් ධූරයේ රාජකාරි කරන්නේ. ඔබතුමා ප්‍රකාශකල බොහෝ දෑ මෙහි සිදුවන්නේ ස්ථිර ලේකම්වරයෙකු නොමැති වීම සහ මෙහි සේවය කරන 80% ක්ම නවක නිලධාරීන් වීම. මම සභාපති හැටියට මට පුළුවන් ශක්තියෙන් වැඩ කරනවා. මම සභාවට හැමදාම එනවා. වැඩ වන ලේකම්වරියට උපදෙස් දෙනවා. නමුත් අවශ්‍ය කරුණු කාරණා ඉටුනොවීම මට විශාල ගැටළුවක්. මේ පිළිබඳව මම ඉහල නිලතල දරණ නිලධාරීන්ට සහ ආණ්ඩුකාරතුමාට දන්වලා තියෙනවා. තවම සාධනීය පිළිතුරක් නැහැ.

අවසාන වශයෙන් අපි ගෙවන අභාග්‍යසම්පන්න කාලය ඉක්මනින් නිමා කිරීමට අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු රජයට ශක්තියක් ඇති බව පවසන්නේ, මේ දෙපළගේ එකතුවෙන් රට වෙලාගෙන තිබුණු තිස් අවුරුදු යුධ ශාපයෙන් අපි ගලවාගත් විශ්වාසය නිසා බැව් මම නැවතත් පවසමින්, අද දින සහභාගි වූ ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රීතුමන්ලාට මෙන්ම, මම කොරෝනා රෝගයට පොදු බව දැනගෙන මුහුණු පොතේ මට ඉක්මන් සුවය පතා, ආශිර්වාද කළ සැමටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින්, ඔබ සියලු දෙනාට නිදුක් නිරෝගී සුවය පතමින්, සභාව අවසන් කරනවා. ස්තුතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ උපකරණ මිලදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

| **විස්තරය** | **සදර්න් ඇග්‍රෝ සර්විස්, ගාල්ල** | **අළුත්ගෙදර හාඩ්වෙයාර්, ගාල්ල** | **ලලිත් අයර්න් වර්ක්ස්, වැබඩ** |
|---|---|---|---|
| අලවංග නො 01 | 2180.00 | 2200.00 | 2250.00 |
| ලීටර් 16 බැටරි ස්ප්‍රේ මැසින් | 7900.00 | 8250.00 | 8500.00 |
| තේ පිහි | 890.00 | 920.00 | 950.00 |
| අත් පොරව | 520.00 | 550.00 | 600.00 |
| තණකොළ කපන තල | 280.00 | 300.00 | 315.00 |
| තණකොළ කපන නූල් | 950.00 මී 50 | 990.00 මී 50 | 420.00 මී 15 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ උපකරණ මිලදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කල සදර්න් ඇග්‍රෝ සර්විස්, ගාල්ල වෙතින් උපකරණ මිලදී ගැනීම සිදු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ යෝජිත ආදාහනාගාරය සඳහා මුල්ගල් තැබීමේ උත්සවය වෙනුවෙන් සමරු ඵලක හා නාම පුවරු සඳහා මිළ ගණන්**

| **විස්තරය** | **චිත්‍රා ගල් කැටයම්, පිටිගල** | **අතුල කන්ස්ට්‍රක්ෂන්, ඇත්කඳුර** | **දර්ශි ඇඩ්වර්ටයිසින් සර්විස්, පිටිගල** |
|---|---|---|---|
| **$24^{11}$ X $48^{11}$ සමරු ඵලක (කළු ගල්)** | **රු. 25000.00** | **රු. 30000.00** | **රු. 28000.00** |
| **$8^{11}$ X $4^{11}$ ඩිජිටල් නාම පුවරු** | **රු. 24000** | **රු. 25000.00** | **රු. 26000.00** |